කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. පී. ඒ. එන්. පියරත්න විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.11.23 දින සහ අංක 92 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කුඩගේලිගේ චමින්ද නිරෝෂන වික්‍රමසූරිය යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිඅටලක්ෂ තුනයි ශත හතලිස්හත (රු. 28,00,003.47)ක මුදලක් 2009.01.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 28,00,003.47ක මුදලට 2009.02.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 92 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එස්. මනම්පේරි මහත්මිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ අතුරුගිරිය ගමේ පිහිටි කහටගහලන්ද නොහොත් ඇටහෙරලියගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක මර්වින් සමරනායක විසින් 1995.02.13 දින මැන සාදන ලද පිඹුරු අංක 4714හි ලොට් අංක 13 දරන කොටස වන උතුරට : ලොට් අංක 14න් ද, නැගෙනහිරට : මොරටුවහේන පාරෙන් ද, දකුණට : මොරටුවහේන පාරෙන් ද, සහ බටහිරට : ලොට් අංක 12න් ද මායිම් වූ එකී අංක 4714 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10)ක් විශාල ඉඩම වන මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී1040/157 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කරන ලද පිඹුර අංක 4714 හි ලොට් අංක 13 දරන කොටස මෑතකදී කරන ලද නැවත මැනුමකට අනුව පහත සවිස්තරව විස්තර වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ අතුරුගිරිය ගමේ පිහිටි කහටගහලන්ද නොහොත් ඇටහෙරලියගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එම්. සමරනායක විසින් 2004.07.18 දින මැන සාදන ලද පිඹුරු අංක 9073හි ලොට් අංක 13 දරන කොටස වන උතුරට : පිඹුරු අංක 4714හි ලොට් අංක 14න් ද, නැගෙනහිරට : මොරටුවහේන පාරෙන් ද, දකුණට : මොරටුවහේන පාරෙන් ද සහ බටහිරට : පිඹුරු අංක 4714හි ලොට් අංක 12න් ද මායිම් වූ එකී අංක 9073 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10)ක් විශාල ඉඩම වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-161/13

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - අම්බලන්ගොඩ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.07.23 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

අම්බලන්ගොඩ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඕ. ඒ. ද සිල්වා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2005.05.31 දින සහ අංක 1437 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඉලංදාරි දේව මාර්ටින් සහ ඉලංදාරි දේව චමින්ද සිරිනන්ද යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ දහහතරදහස් පනස්අටයි ශත හතලිස්තුන (රු. 4,14,058.43)ක මුදලක් 2008.07.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 4,14,058.43ක මුදලට 2008.08.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1437 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත

උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

(1) දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, කරන්දෙණියේ, ඊඩින් එස්ටේට් නොහොත් ඊඩින්වත්ත නොහොත් දෙඹරගොඩකැලේ, නොහොත් ගම්මිරිස්වත්ත නමැති ඉඩමට බලයලත් මානක ටී. බී. ඒ. ද සිල්වා විසින් මැන සාදන ලද 1982.02.25 දිනැති සහ අංක 1440 දරන පිඹුරෙහි ලොට් අංක 2 දරන කොටස වන ඊසානදිගට : මෙම ඉඩමේම ලොට් 1 සහ පාරෙන් ද, ගිණිකොණට : මෙම ඉඩමේම ලොට් අංක 4න් ද, දකුණට : මාදුගඟෙන් ද සහ නිරිතදිගට : මාදුගඟෙන් මායිම් වූ අක්කර එකයි පර්චස් හය (අ. 1, රූ. 0, පර්. 6) ක් විශාල ඉඩම සහ සියළුදේත් සමග වේ. පිඹුරු අංක 1440හි ලොට් අංක 41 දරන කොටසේ මාර්ග අයිතියද සමග වේ.

(2) දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, කරන්දෙණියේ, ඊඩින් එස්ටේට් නොහොත් ඊඩින්වත්ත නොහොත් දෙඹරගොඩකැලේ, නොහොත් ගම්මිරිස්වත්ත නමැති ඉඩමට බලයලත් මානක ටී. බී. ඒ. ද සිල්වා විසින් මැන සාදන ලද 1982.02.25 දිනැති සහ අංක 1440 දරන පිඹුරෙහි ලොට් අංක 3ඒ සහ 3බී දරන ඉඩම් කොටස් වලට ඊසානදිගට : මාදුගඟෙන් ද, ගිණිකොණට : මෙම ඉඩමේම ලොට් අංක 7ඒ වලින් ද, නිරිතදිගට : පාරෙන් ද සහ වයඹට : මෙම ඉඩමේම ලොට් අංක 1න් ද මායිම් වූ රූඩ් දෙක (අ. 0, රූ. 2, පර්. 0) ක් විශාල ඉඩම සහ සියළුදේත් සමග වේ. පිඹුරු අංක 1440හි ලොට් අංක 41 දරන කොටසේ මාර්ග අයිතියද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-161/14

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - අම්බලන්ගොඩ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.07.23 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. පුංචිහේවා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2006.08.21 දින සහ අංක 8161 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම විජිත වීරතුංග යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ අනූනමදහස් දෙසිය හත්තෑහතරයි ශත හැත්තෑව (රු. 4,99,274.70)ක මුදලක් 2008.08.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 4,99,274.70ක මුදලට 2008.09.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 8161 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල බෙන්තොට වලල්ලාවිට කෝරළේ, හිපන්කන්දෙහි පින්නගලවක්මැන්න, දෙල්ගහවත්ත, ජම්බුගහහේන, දෙල්ගහවත්ත, ඉඹුල්ගහවෙල, උඩුමුල්ලේදෙණිය සහ දෙල්ගහවෙල දරන ඉඩමට බලයලත් මානක එස්. සෙනෙවිරත්න විසින් මැන සාදන ලද 1975 අප්‍රේල් මස 1 සහ 7 වැනි දිනැති සහ අංක 1548 දරන පිඹුරෙහි ලොට් අංක II දරන කොටස වන උතුරට : මෙම ඉඩමේම ලොට් අංක 12 සහ 4න් ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් අංක 12න්, ආරොන් සිංඤ්ඤෝට අයිති කුඹුරෙන් සහ ටී. පී. 180981හි ලොට් අංක 13න් සහ මෙම ඉඩමේ ටී. පී. 288688හි ලොට් අංක 13න් ද, දකුණට : පාරෙන් ද සහ බස්නාහිරට : ලොට් අංක 10න් මායිම් වූ රූඩ් තුන (අ. 0, රූ. 3, පර්. 0)ක් විශාල ඉඩම ගොඩනැගිලි, ගහකොළ, සියළුදේත් සමග වේ. මෙම ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 121/227 යටතේ ලියාපදිංචි වී ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-161/15

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බොරැල්ල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.07.23 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. විසින් ග්‍රේට්වෝල් ඇපරල් මැෂිනරි (ප්‍රයිවෙට්) ලිමිටඩ් (කලින් "ජින්ටෙල් එම්බ්‍රොයිඩර් මැෂිනරි

(ප්‍රයිවට්) ලිමිටඩ්" හඳුන්වනු ලැබූ) සමාගමට සපයන ලද ණය මුදල් ආපසු ගෙවන බවට සුරැකුමක් වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2008.07.31 දින සහ අංක 3224 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම "ග්‍රේට්වෝල් ඇපරල් මැෂිනරි (ප්‍රයිවට්) ලිමිටඩ්" (කලින් "ජින්ටෙල් එම්බ්‍රොයිඩර් මැෂිනරි (ප්‍රයිවට්) ලිමිටඩ්" හඳුන්වනු ලැබූ) යන අය ණයකරු හැටියට සහ සමන් ජයසිංහ යන අය උකස්කරු හැටියට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කර ඇති හෙයින් සහ ඉහත කී සමන් ජයසිංහ යන එකී ග්‍රේට්වෝල් ඇපරල් මැෂිනරි (ප්‍රයිවට්) ලිමිටඩ් (කලින් "ජින්ටෙල් එම්බ්‍රොයිඩර් මැෂිනරි (ප්‍රයිවට්) ලිමිටඩ්" නමින් හඳුන්වනු ලැබූ) සමාගමේ සියලු සහ සමස්ත කොටස් හිමි බැවින් ද, සහ ඉහත කී සමන් ජයසිංහ යන අය ඉහත කී ග්‍රේට්වෝල් ඇපරල් මැෂිනරි (ප්‍රයිවට්) ලිමිටඩ් (කලින් "ජින්ටෙල් එම්බ්‍රොයිඩර් මැෂිනරි (ප්‍රයිවට්) ලිමිටඩ්" නමින් හඳුන්වනු ලැබූ) සමාගමේ අධ්‍යක්ෂවරයා වශයෙන් එම සමාගමේ පාලනය සහ කළමණාකරණය දරන අතර ඒ අනුව එකී සමන් ජයසිංහ යන අය ඉහත කී ග්‍රේට්වෝල් ඇපරල් මැෂිනරි (ප්‍රයිවට්) ලිමිටඩ් (කලින් "ජින්ටෙල් එම්බ්‍රොයිඩර් මැෂිනරි (ප්‍රයිවට්) ලිමිටඩ්" නමින් හඳුන්වනු ලැබූ) අයිතිකරු සහ පාලනය දරන තැනැත්තා වන අතර, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් ග්‍රේට්වෝල් ඇපරල් මැෂිනරි (ප්‍රයිවට්) ලිමිටඩ් (කලින් ජින්ටෙල් එම්බ්‍රොයිඩර් මැෂිනරි (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් හඳුන්වනු ලැබූ) සමාගමට සැපයූ මූල්‍ය පිළිසරණයන්හි නියම ආර්ථලාභියා එකී සමන් ජයසිංහ යන අය වන හෙයින් ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු මුදල් ආපසු ගෙවීම එකී ග්‍රේට්වෝල් ඇපරල් මැෂිනරි (ප්‍රයිවට්) ලිමිටඩ් (කලින් "ජින්ටෙල් එම්බ්‍රොයිඩර් මැෂිනරි (ප්‍රයිවට්) ලිමිටඩ්" නමින් හඳුන්වනු ලැබූ) සහ සමන් ජයසිංහ යන අය විසින් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැටනවලක්ෂ දෙසීය තිහයි ශත හැටහතර (රු. 69,00,230.64)ක මුදලක් 2009.04.27 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 69,00,230.64ක මුදලට 2009.04.28 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 3224 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ ගංගොඩවිල පිහිටි සුභද්‍රාරාම පාර, 2 වැනි පටුමගේ, වරිපනම් අංක 7 දරන "ගනේලන්ද වත්ත" නමැති ඉඩමට බලයලත් මානක එස්. ඩී. ලියනසූරිය විසින් මැන සාදන ලද අංක 2369 සහ 1981 ඔක්තෝබර් මස 27 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 4ඒ" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : සුභද්‍රාරාම පාර, 2 වැනි පටුමගේ, වරිපනම් අංක 95/5 සහ 95/8 දරන පරිශ්‍රයන්ගෙන් ද, නැගෙනහිරට : ලොට් 4බී සහ 4ඒ වලින් ද, දකුණට : සුභද්‍රාරාම පාර, 2 වැනි පටුමගින් සහ ලොට් 4ඊ වලින් ද, සහ බස්නාහිරට : සුභද්‍රාම පාර, 2 වැනි පටුමගේ වරිපනම් අංක 99/3 දරන පරිශ්‍රයෙන් ද මායිම් වූ එකී අංක 2369 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසිඑකයි දශම තුන (අ. 0, රූ. 0, පර්. 21.3) ක විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වන අතර, මෙය දෙල්කඳ-නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 3090/III ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම් කොටස මෑතක දී බලයලත් මානක ජේ. ඒ. ඩබ්. කාවාලෝ විසින් 2008 මැයි 14 වැනි දින අංක 25/2008 දරන පිඹුර ප්‍රකාරව කරන ලද මැනීමකට අනුව මෙසේ විස්තර වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ ගංගොඩවිල පිහිටි සුභද්‍රාරාම පාර, 2 වැනි පටුමගේ, වරිපනම් අංක 7 දරන "ගනේලන්දවත්ත" නමැති ඉඩමට එකී අංක 25/2008 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් ඒ" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : සුභද්‍රාරාම පාර, 2 වැනි පටුමගේ, වරිපනම් අංක 95/5 සහ 95/8 දරන පරිශ්‍රයන්ගෙන් ද, නැගෙනහිරට : සුභද්‍රාරාම පාර, 2 වැනි පටුමගේ, වරිපනම් අංක 7/1 දරන පරිශ්‍රයෙන් සහ අංක 2369 දරන පිඹුරේ ලොට් 4ඒ වලින් ද දකුණට : සුභද්‍රාරාම පාරේ, 2 වැනි පටුමගෙන් සහ අංක 2369 දරන පිඹුරේ ලොට් 4ඊ වලින් ද සහ බස්නාහිරට : සුභද්‍රාරාම පාර, 2 වැනි පටුමගේ, වරිපනම් අංක 5ඒ දරන පරිශ්‍රයෙන් ද මායිම් වූ එකී අංක 25/2008 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසිඑකයි දශම තුන (අ. 0, රූ. 0, පර්. 21.3) ක විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-161/16

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : කේ/14/5667/කේවයි3/820.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2009.03.11 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. අම්පාර ප්‍රසිද්ධ නොතාරිස් වන ඒ. යූ. පී. උක්වත්ත විසින් සහතික කරන ලද 2003.01.08 දින හා අංක 845 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, උහන පදිංචි යාපා මුදියන්සේලාගේ කරුණාරත්න නොහොත් යාපා මුදියන්සේලාගේ කරුණාරත්න බණ්ඩාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2009.01.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ හැට දෙදහස් හාරසිය අනූදෙකයි ශත අසූනවය (රු. 3,62,492.89)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 845 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හැට අටයි ශත අසූතුන (රු. 168.83) බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු විය යුතුය.)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ

වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, බදුල්ල, කළුගල්පිටිය, අංක 48/1හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. ජයතිලක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

අම්පාර දිස්ත්‍රික්කයේ, වැව්ගම් පත්තුවේ, ජනපදයගම, අංක 23හි පිහිටි 23/129, ගලහිටියාගොඩ නමැති ඉඩමේ 1998.03.02 දින බලයලත් මිනින්දෝරු කන්දසාමි කුමාරසාමි විසින් සකසන ලද අංක 10605 දරන මිණුම් පිඹුරේ දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 01, රූ. 01, පර්. 0ක් වූ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙම ඉඩම අම්පාර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක යූ 38/20හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 අගෝස්තු මස 19 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

09-112/1

---

වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මාතර, කොටුවට, ශ්‍රී ධර්මාරාම මාවත, අංක 14හි හි බලයලත් වෙන්දේසිකාර එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ගමේ ගල්ගොඩගාවහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු රෝහණ උයන්ගොඩ විසින් 2004.11.04 වැනි දින මැන සකසන ලද 13404 දරන පිඹුරේ කැබලි අංක 1සී ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 1.2ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි වගාවන් සහ ගොඩනැගිලි ආදියත් වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 අගෝස්තු මස 19 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

09-112/2

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද විසින් ලියා සහතික කරන ලද අංක 9444 හා 2003 පෙබරවාරි මස 07 වැනි දින දරන මුල් උකස් බැඳුම්කරය සහ අංක 9501 හා 2003 මාර්තු මස 05 වැනි දින දරන උකස් බැඳුම්කරය මත ද ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. සී. එච්. මැණිකේ විසින් ලියා සහතික කරන ලද අංක 1663 හා 2006 නොවැම්බර් මස 15 වැනි දින දරන උකස් බැඳුම්කරය මත සහ අංක 2387 හා 2008 පෙබරවාරි මස 12 වැනි දින දරන මුල් උකස් බැඳුම්කරය මත ද අයවිය යුතු මුදල් ගෙවීම, සිරිලක් එන්ජිනියරිං යන නාමය අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන බදුල්ලේ, පතිරණගේ දොන් ආනන්ද යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 ජනවාරි මස 31 වැනි දිනට ඉහත කී අංක 9444, 9501, 1663 හා 2387 දරන උකස් බැඳුම්කර මත ඉහත කී පතිරණගේ දොන් ආනන්ද යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හැත්තෑහතර ලක්ෂ පන්දහස් හයකුත් ශත එකොළහක (රු. 74,05,006.11) මුදලක් සහ 2009 පෙබරවාරි මස 01 වැනි දින සිට

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : ජී. එල්. 09/00939/ජීඒ1/548.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2008.07.14 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. මාතර ප්‍රසිද්ධ නොතාරිස් වන සී. ඩබ්. ගුණවර්ධන විසින් සහතික කරන ලද 2005.08.05 දින හා අංක 18631 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කොටපොල පදිංචි සුමිත් සමරසිංහ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2008.06.05 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ විසිහත්දහස් අටසිය හතලිස් එකයි ශත අසූහය (රු. 4,27,841.86)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 18631 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය අසූ හතරයි ශත හැටදෙක (රු. 184.62) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු විය යුතුය.)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ

විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පන්ලක්ෂ පනස්පන්දහස් අටසිය හතලිස් දෙකක් (රු. 5,55,842) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 01, අප්‍රේල් මස 01, ජූලි මස 01 සහ ඔක්තෝබර් මස 01 යන දිනවල දී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද,

රුපියල් විසිඑක් ලක්ෂ හතලිස් දහස් නවසිය අනූ අටක් (රු. 21,40,998) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි මස 01, අප්‍රේල් 01, ජූලි 01 සහ ඔක්තෝබර් මස 10 යන දිනවලදී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද,

රුපියල් තිස්හතර ලක්ෂ හැත්තෑඑක් දහස් හාරසිය විසිනවයක් (රු. 34,71,429.00) සඳහා (සංශෝධනයට යටත් හා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර සතිපතා පදනම මත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පළකරනු ලබන) පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින්,

එනම්,

(අ) බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ; හෝ

(ආ) රඳවා ගැනීමේ බදු අඩු කිරීමෙන් පසු, දවස් 91 භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහළ සියයට දශම පහට (0.5%) තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහල අනුපාතිකයට වර්ෂයකට සියයට දහයකුත් දශම පහක් (10.5%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් හැත්තෑහතර ලක්ෂ පන්දහස් හයකුත් ශත එකොළහක (රු. 74,05,006.11) මුදලක් සහ 2009 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පන්ලක්ෂ පනස්පන්දහස් අටසිය හතලිස් දෙකක් (රු. 5,55,842) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 01, අප්‍රේල් 01, ජූලි 01 සහ ඔක්තෝබර් මස 01 යන දිනවලදී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද,

රුපියල් විසිඑක් ලක්ෂ හතලිස් දහස් නවසිය අනූ අටක් (රු. 21,40,998) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 01, අප්‍රේල් 01, ජූලි 01 සහ ඔක්තෝබර් 01 යන දිනවලදී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද,

රුපියල් තිස්හතර ලක්ෂ හැත්තෑඑක් දහස් හාරසිය විසිනවයක් (රු. 34,71,429) සඳහා (සංශෝධනයට යටත් හා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර සතිපතා පදනම මත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පළකරනු ලබන පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින්,

එනම්,

(අ) බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ; හෝ

(ආ) රඳවා ගැනීමේ බදු අඩු කිරීමෙන් පසු, දවස් 91 භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහළ සියයට දශම පහට (0.5%) තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේදී බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට වර්ෂයකට සියයට දහයකුත් දශම පහක (10.5%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 9444, 9501, 1663 හා 2387 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 9444, 9501 සහ 1663 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල නගරය සහ කඩවත් සතර පුවක්ගොඩමුල්ලේ පිහිටි "ස්ටැන්ලිස් ලෑන්ඩ්" යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩම වන, බලයලත් මිනින්දෝරු එම්. ෆුවාඩ් ඉස්මයිල් විසින් මැන සාදන ලද අංක 123 හා 1970 ජූලි මස 08 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ඉඩමට මායිම්, උතුරට : කතෝනිස්ට අයත් වත්ත ද, නැගෙනහිරට : ඇළ ද, දකුණට : ටී. බී. අබේවර්ධනගේ වත්ත ද, බස්නාහිරට : මහියංගනය පාර ද යන මායිම් ඇතුළත පර්චස් විසිහතක් (අ. 0, රූ. 0, පර්. 27) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි මහියංගනය පාර වරිපනම් අංක 102 දරන ගොඩනැගිල්ල හා වෙනත් සියලු දේ. මෙම ඉඩම බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

**අංක 2387 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

ඌව පළාතේ, බදුල්ල මහනගර සභා සීමාව ඇතුළත, මහවෙලගම පුවක්ගොඩමුල්ලේ පිහිටි, "මහවෙල ගන්නිලේකුඹුර" නමැති ඉඩමේ (බලයලත් මිනින්දෝරු ඒ. ඒ. එස්. අමරසේකර විසින් මැන සාදන ලද අංක 47 දරන පිඹුරේ ලොට් අංක 1, 2, 3 සහ 5 ඒකාබද්ධකර නැවත මැනීමක් වන) බලයලත් මිනින්දෝරු ඒ. ඒ. එස්. අමරසේකර විසින් මැන සාදන ලද අංක 494 හා 2000.02.10 දින දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : පැල ඉණි වැට ද, නැගෙනහිරට : ලොට් අංක 3, 2 සහ ඉහත සඳහන් අංක 47 දරන පිඹුරේ ලොට් අංක 4 ද, දකුණට : අංක 47 දරන පිඹුරේ ලොට් අංක 06 ද, බස්නාහිරට : කාණුව ද යන මායිම් ඇතුළත පර්චස් විසිනවයකුත් දශම හතයි පහක් (රු. 0, රූ. 0, පර්. 29.75) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි

පිහිටි සියලු දේ. මෙම ඉඩම බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

මෙයට, ඉහත කී බදුල්ල මහ නගර සභා සීමාව ඇතුළත, මහවෙලගම, පුවක්ගොඩමුල්ලේ පිහිටි, "මහවෙල ගන්තිලේකුඹුර" නමැති ඉඩමේ ඉහත සඳහන් අංක 494 දරන පිඹුරේ, ලොට් අංක 03 ලෙස දැක්වෙන (මාර්ග ප්‍රවේශය වූ) බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : පැළ ඉණි වැට ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ලොට් අංක 02 ද සහ බස්නාහිරට : ලොට් අංක 01 ද යන මායිම් ඇතුළත පර්චස් තුනක් (අ. 0, රූ. 0, පර්. 3) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කට්ටිය මතින් සහ ඔස්සේ පොදු පාරක් ලෙස පාවිච්චි කිරීමේ අයිතිවාසිකම ඇතුළත් වේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

09-62/3

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට බදුල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. සී. එච්. මැණිකේ විසින් ලියා සහතික කරන ලද අංක 1004 හා 2006 ජනවාරි මස 10 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම මහියංගනයේ යාපා මුදියන්සේලාගේ කරුණා වීරරත්න සහ යාපා මුදියන්සේලාගේ රත්නපාල යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 ජනවාරි මස 31 වැනි දිනට ඉහත කී අංක 1004 දරන උකස් බැඳුම්කරය මත එකී යාපා මුදියන්සේලාගේ කරුණා වීරරත්න සහ යාපා මුදියන්සේලාගේ රත්නපාල යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් නවලක්ෂ විසිදෙදහස් හයසිය අසූ හතකුත් ශත තිස්එකක (රු. 9,22,687.31) මුදලක් සහ 2009 පෙබරවාරි මස 01 වැනි දි සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පන්ලක්ෂ අනූනවදහස් නවසිය අනූවක් (රු. 5,99,990) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ප්‍රථම වැඩකරන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකයක් මත පොළිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් නවලක්ෂ විසිදෙදහස් හයසිය අසූහතකුත් ශත තිස්එකක (රු. 9,22,687.31) මුදල සහ 2009 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පන්ලක්ෂ අනූනවදහස් නවසිය අනූවක් (රු. 5,99,990) සඳහා එක් එක් වර්ෂයේ සෑම ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ප්‍රථම වැඩකරන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම් හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1004 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

#### අංක 1004 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බින්තැන්න කෝරළේ, රිදීමාලියැද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සෙරණ ග්‍රාම නිලධාරී වසමේ, සෙරණගම ග්‍රාමයේ පිහිටි බිම් කට්ටියක් වන බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : කුඹුකෙ ඇළ රිසවේසම ද, නැගෙනහිරට : කුඹුකෙ ඇළ රිසවේසම ද, දකුණට : පාර සඳහා රිසවේසම ද, බස්නාහිරට : පාර සඳහා රිසවේසම ද යන මායිම් ඇතුළත රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

දෙහිඅත්තකන්ඩියේ බලයලත් මිනින්දෝරු ටී. බී. එස්. සංගරන්දෙණිය විසින් මෑතකදී මැන සාදන ලද අංක 3132 හා 2003 ඔක්තෝබර් මස 22 වැනි දින දරන පිඹුරට අනුව ඉහත සඳහන් ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ :

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බින්තැන්න කෝරළේ, රිදීමාලියැද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සෙරණ ග්‍රාම නිලධාරී වසමේ, සෙරණගම පිහිටි, සෙරණගමයාය යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ, බලයලත් මිනින්දෝරු ටී. බී. එස්. සංගරන්දෙණිය විසින් මැන සාදන ලද අංක 3132 හා 2003 ඔක්තෝබර් මස 22 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 01 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : රජයේ මුඩු බිම ද, නැගෙනහිරට : කුඹුකෙ ඇළ රිසවේසම ද, දකුණට : පාර සඳහා රිසවේසම ද, බස්නාහිරට : පාර සඳහා රිසවේසම ද යන මායිම් ඇතුළත රූඩ් එකක් (අ. 0, රූ.1, පර්. 0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

09-62/2

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.06.12 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී :

1. ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මයා. විසින් සහතික කරන ලද 2005.07.29 වැනි දිනැති අංක 4053 දරන උකස්කරය මත මුල් මුදල් හා 2008.08.11 වැනි දින තෙක් පොලිය වශයෙන් රුපියල් පන්ලක්‍ෂ පනස් එක්දහස් හත්සිය එකොළහයි ශත එකොළහක (රු. 5,51,711.11) මුදල සමඟ රුපියල් පන්ලක්‍ෂයක (රු. 5,00,000) මුදල මත 2008.08.12 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට තිස්හතරක (34%) වාර්ෂික පොළියක් ද පිළිමතලාව, හිරැස්සගල වත්ත, අංක 55 දරන ස්ථානයේ පදිංචි දිලීප සමරවීර මයාගෙන් ලංකා බැංකුවට අයවිය යුතුව ඇත.

2. ඉහත කී 2005.07.29 දිනැති අංක 4053 දරන බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් පන්ලක්‍ෂ පණස් එක්දහස් හත්සිය එකොළහයි ශත එකොළහක (රු. 5,51,711.11) මුදල සමඟ 2008.08.12 වැනි දින සිට විකිණීම කරන දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරන ලද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරිංටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වැනි වගන්තිය හා එහි සංශෝධනයන් යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### ඉහත කී උපලේඛනය

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව, කළුගම්මනසියපත්තු හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා සීමාවතුළ, යටිහලගල හෙවත් යටිහලගල උඩගම හි (ඔප්පුවේ "යටිහලගල" යයි සඳහන් කර ඇති) පිහිටි, බලයලත් මිනින්දෝරු ඊ. කේ. ඩී. ජේ. එස්. කේ. සිරිවර්ධන මයා විසින් සාදන ලද 2004 සැප්තැම්බර් මස 18 වැනි දිනැති අංක 1430 දරන පිඹුරේ කැබලි 3 යනුවෙන් පෙන්නුම් කර ඇති, "පදිංචිවහිටිනා ගෙදර වත්ත" යයි හඳුන්වනු ලබන, ඉහත කී අංක 1430 දරන පිඹුර අනුව, ඊශාන දෙසට : අඩි පාර වෙන්කරන ජීව වැට ද, නැගෙනහිරට : ආර්. අයි. ජේ. පොහොලපිටිය විසින් හිමිකම් කියන ලද තිතපජ්ජලයා ගේ වත්ත ඉඩම ද, දකුණ හා නිරිත දෙසට : බරිගම සිට පේරාදෙණියට යන පාර ද, බස්නාහිරට කැබලි 1 ද, මායිම් වූ, පර්චස් තිස්දෙකක (අක්. 0, රූ. 0, පර්. 32) වපසරියෙන් යුත්, බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල හා එහි තුළ ඇති ගස්, වගාවන් හා අනෙකුත් සෑම සියළු දේත් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච්. 752/90 හි ලියාපදිංචි කර ඇත.

2. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව, කළුගම්මනසියපත්තු, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා සීමාව තුළ, යටිහලගල හෙවත් යටිහලගල උඩගම හි (ඔප්පුවේ "යටිහලගල" යයි සඳහන් කර ඇති) පිහිටි, බලයලත් මිනින්දෝරු ඊ. කේ. ඩී. ජේ. එස්. කේ. සිරිවර්ධන මයා විසින් සාදන ලද 2004 සැප්තැම්බර් මස 18 වැනි දිනැති අංක 1430 දරන පිඹුරේ කැබලි 4 යනුවෙන් පෙන්නුම් කර ඇති, "පදිංචිව හිටිනා ගෙදර වත්ත" යයි හඳුන්වනු ලබන එකී අංක 1430 දරන පිඹුර අනුව, ඊශාන දෙසට : බරිගම සිට පේරාදෙණියට යන පාර ද, නැගෙනහිරට : ආර්. අයි. ජේ. පොහොලපිටිය විසින් හිමිකම් කියන ලද තිතපජ්ජලයාගේ වත්ත වෙන් කරන ජීව වැට ද, දකුණට : ඇළ හා පන්සලේ කුඹුර ද, බස්නාහිරට : කැබලි 2 මායිම් වූ, පර්චස් දහ නවයයි දශම අටක (අක්. 0, රූ. 0, පර්. 19.8) ප්‍රමාණයෙන් යුත්, බෙදා වෙන් කරන ලද සියලු ඉඩම් කට්ටිය හා එහි තුළ ඇති ගස්, වගාවන් හා සෑම සියලු දේත් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච්. 752/201 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. තිලකරත්න මයා.,
කළමනාකරු.

ලංකා බැංකුව,
2 වන ශාඛාව,
මහනුවර.

09-108

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.06.12 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී :

1. ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මහතා විසින් සහතික කරන ලද 2007.10.09 වැනි දිනැති අංක 6028 දරන උකස්කරය මත මුල් මුදල් හා 2009.03.16 වැනි දින තෙක් පොලිය වශයෙන් රුපියල් විසිදෙලක්ෂ දහතුන්දහස් පන්සිය අනූහතරයි ශත හැටපහක (රු. 22,13,594.65) මුදල සමඟ රුපියල් දහහත් ලක්‍ෂ අනූහතර දහස් එකසිය අසූතුනක (රු. 17,94,183.00) මුදල මත 2009.03.17 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට විසිතුනක (23%) වාර්ෂික පොළියක් ද, මයිලපිටිය, කිවුලතැන්න, අංක 129/1 දරන ස්ථානයේ පදිංචි ජයවර්ධන රත්නායකගේ ධම්වර්ධන මයා., පාතමයිලපිටිය, අංක 219 දරන ස්ථානයේ පදිංචි කුඩාබදුගේ විජිත අසේල කරුණාරත්න මයා. හා ජයවර්ධන රත්නායක ගේ ජීවනි අසංකා ජයවර්ධන මිය. යන අයවළුන්ගෙන් ලංකා බැංකුවට එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. ඉහත කී 2007.10.09 දිනැති අංක 6028 දරන බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් විසිදෙලක්‍ෂ දහතුන්දහස් පන්සිය අනූහතරයි ශත හැටපහක (රු. 22,13,594.65) මුදල සමඟ 2009.03.17 වැනි දින සිට විකිණීම කරන දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරන ලද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරිංටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වැනි වගන්තිය හා එහි සංශෝධනයන් යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### ඉහත කී උපලේඛනය

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පහ දුම්බර හේවාවිස්ස කෝරළේ, පහත හේවාහැට ප්‍රාදේශීය සභා සීමාව තුළ, මයිලපිටියේ පිහිටි,

බලයලත් මිනින්දෝරු ජී. ආර්. ඩබ්. එම්. වීරකෝන් මයා. විසින් සාදන ලද 2004 මාර්තු මස 07 වැනි දිනැති අංක 13651 දරන පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති, කිවුලතැන්න යයි හඳුන්වනු ලබන, එකී අංක 13651 දරන පිඹුර අනුව, උතුරට : වයි. එම්. මුතුබණ්ඩාගේ කිවුලතැන්න හි කොටස ද, නැගෙනහිරට : බණ්ඩාගේ කිවුලතැන්න හි කොටස ද, දකුණට : සිරිල්සිංහ ආරච්චිගේ කිවුලතැන්න හි කොටස ද, බස්නාහිරට : කැබලි 3 ද මායිම් වූ, අක්කර තුනයි, රූඩ් තුනයි, පර්චස් දෙකයි දශම දෙකයි බින්දුවක (අක්. 3, රූ. 3, පර්. 02.20) වපසරියෙන් යුත්, බෙදා වෙන් කරන ලද සියලු ඉඩම් කට්ටිය, එහි තුළ පිහිටා ඇති ගොඩනැගිලි, ගස්, වගාවන් හා අනෙකුත් සෑම සියලු දේත් වේ.

2. ඉහත සඳහන් පරිදි මයිලපිටියේ පිහිටි, එකී අංක 13651 දරන පිඹුරේ කැබලි 2 යනුවෙන් පෙන්නුම් කර ඇති, "කිවුලතැන්න" යයි හඳුන්වනු ලබන, ඉහත කී අංක 13651 දරන පිඹුර අනුව, උතුරට : වයි. එම්. මුතුබණ්ඩාගේ කිවුලතැන්න හි කොටස ද, නැගෙනහිරට : කැබලි 3 ද, දකුණට : සිරිල්සිංහ ආරච්චිගේ කිවුලතැන්න හි කොටස ද, බස්නාහිරට : ඇළද, මායිම් වූ රූඩ් දෙකයි පර්චස් අටක (අක්. 0, රූ. 2, පර්. 08.00) වපසරියෙන් යුත් බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල, එහි තුළ පිහිටා ඇති ගොඩනැගිලි, ගස්, වගාවන් හා අනෙකුත් සෑම සියලු දේත් වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. එන්. පී. ගුණසේකර මයා.,
කළමනාකරු.

ලංකා බැංකුව,
තලාතුඔය ශාඛාව.

09-109

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.07.09 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී :

1. මහජන නොතාරිස් ජී. සී. පී. තිලකරත්න විසින් සහතික කරන ලද 1998.01.08 දිනැති අංක 413 දරන බැඳුම්කරය සහ මහජන නොතාරිස් එස්. ඩී. ද. එස්. ගුණසේකර විසින් සහතික කරන ලද 1998.11.16 දිනැති අංක 998 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.02.10 දක්වා ණය සහ අයිරා ගිණුම් සඳහා පොලිය වශයෙන් රුපියල් හතලිස් අටලක්ෂ හතලිස් දහස් හයසිය අටයි ශත හැටපහක (රු. 48,40,608.65) මුදලක් සමඟ ණය ගිණුම මත රුපියල් හත්ලක්ෂ හැත්තෑතුන් දහස් හයසිය හැටනවයක (රු. 7,73,669) මුදලක් මත වසරකට සියයට දහසය (16%) බැගින් පොලියක් ද, රුපියල් තුන්ලක්ෂ තිස්නව දහස් නවසිය හැත්තෑව (රු. 3,39,970) ක් මත වසරකට සියයට විසිපහ (25%) බැගින් පොලියක් ද, ස්ථිර අයිරා ගිණුමෙහි ශේෂය වෙනුවෙන් රුපියල් පන්ලක්ෂ අනූනවදහස් හාරසිය අසූඑකයි ශත හතක් (රු. 5,99,481.07) මත වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් පොලියක් ද, 2009.02.11 දින සිට ගෙවීම නිම කරන තෙක් දූනගහ, හේන්පිටගෙදර පදිංචි සෙම්බුකුට්ටි ආරච්චිගේ සුදත් චන්ද්‍රසිරි මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 413 සහ 998 දරන බැඳුම්කර මත අයවිය යුතු එකී රුපියල් හතලිස් අටලක්ෂ හතලිස් දහස් හයසිය අටයි ශත හැටපහක (රු. 48,40,608.65) මුදල සමඟ 2009.02.11 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහතකී ආකාරයට අයවියයුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3, ටී. එම්. ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, මිනුවන්ගොඩ ශාඛාවේ ශාඛා කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසය තුළ, අලුත්කුරු කෝරළේ දූනගහපත්තුවේ, අධිකාරිමුල්ල සහ දූනගහ ග්‍රාමයන්හි පිහිටි දවටගහ කුඹුර, ගලකුඹුර නැතහොත් කැකුණගහකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. නන්දන සෙනෙවිරත්න විසින් සාදනලද 1996.03.30 දිනැති අංක 2996 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස නම්කර මායිම් නිර්ණය කර නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : කලින් ඇලිස් පෙරේරා ගුණවර්ධනගේ වත්තට අයත්ව පැවති දැනට එච්. එම්. කරුණාරත්නට අයිති දේපලක් ද, නැගෙනහිරට : නිල්පනාගොඩ දූනගහ මහ පාර ද, දකුණට : ඇල ද, බස්නාහිරට : එස්. ඒ. එන්. අයි. සුබසිංහට සහ වෙනත් අයට අයිති කුඹුරද මායිම්ව රූඩ් තුනයි, පර්චස් දහනවයයි දශම දෙකයි පහක (අ. 0, රූ. 3, පර්. 19.25) වපසරියකින් යුක්තවන අතර, එයට අයත් සියලු දේද වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 777/174 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

කේ. ඒ. විජේසිංහ,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
මිනුවන්ගොඩ ශාඛාව.

09-110

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.07.09 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

1. මහජන නොතාරිස් බී. බී. රණසිංහ විසින් ලියා සහතික කරන ලද 2007.07.11 දිනැති අංක 3192 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.01.19 දින තෙක් පොලිය වශයෙන් රුපියල් හතලිස් හයලක්ෂ විසිහත් දහස් හයසිය හැත්තෑහයයි ශත තිස් එකක (රු. 46,27,676.31) මුදලක් සමඟ රුපියල් හතලිස් එක් ලක්ෂ හැත්තෑතුන් දහස් හත්සිය විසිතුනයි ශත හතලිහක (රු. 41,73,723.40) මුදලක් මත වසරකට සියයට දාහතයි දශම එකයි හත (17.17%) බැගින් පොලියක් ද, 2009.01.20 දින

සිට ගෙවීම නිමකරන දිනය තෙක් මුල්ලේරියාව නව නගරය, හිඹුටාන, අංක 344/1 බී හි පදිංචි චන්න හෙට්ටිගේ මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 3192 දරන බැඳුම්කර මත අයවිය යුතු එකී රුපියල් හතලිස් හයලක්ෂ විසිහත් දහස් හයසිය හැත්තෑහයයි ශත තිස් එකක (රු. 46,27,676.31) මුදල සමඟ 2009.01.20 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහතකී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3, හි පදිංචි T & H ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, කොළොන්නාව ශාඛාවේ, ශාඛා කළමනාකරුටද මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

### පළමුවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ (බත්තරමුල්ල උප කාර්යාලය) තලංගම දකුණ පිහිටි ගොඩැල්ලවත්ත පාරෙහි වරිපනම් අංක 29/20 දරන “ගොරකගහවත්ත” නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1998 නොවැම්බර් මස 29 දිනැති අංක 8985 දරන මිනුම් පිඹුරේ ලොට් X ලෙස සටහන් කොට මායිම් නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් X උතුරට : එම ඉඩමේ ලොට් 2 සහ අඩි 10 ක් පළල පාර (අංක 504 දරන පිඹුරෙහි ලොට් 3එෆ්) ද, නැගෙනහිරට : අඩි 10ක් පළල පාරද (අංක 504 දරන පිඹුරෙහි ලොට් 3එෆ්) සහ අංක 504 දරන පිඹුරෙහි ලොට් 3ඩී ද, දකුණට : අංක 504 දරන පිඹුරෙහි ලොට් 3බී ද, බස්නාහිරට : ඩබ්. ඒවිස් පෙරේරාගේ ඉඩම ද, මායිම්ව අංක 8985 දරන පිඹුර ප්‍රකාර පර්චස් 14 (අ. 0, රූ. 0, පර්. 14) ක වපසරියකින් යුක්තවන අතර, එහි ඇති ගොඩනැගිල්ල සහ සියළු දේද වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී1323/17 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවැනි උපලේඛනය

1. ඉහත කී පරිදි, තලංගම දකුණ පිහිටි ගොරකගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්. පතිරණ විසින් සාදන ලද 1984 අප්‍රේල් මස 03 දිනැති අංක 323 දරන මැනුම් පිඹුරේ ලොට් 6 (පාරට වෙන්කළ කොටස) ලෙස සටහන් කොට මායිම් නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් 6 උතුරට: ගොඩැල්ලෙවත්ත පාර ද, නැගෙනහිරට : ඩබ්. සෝමදාස හා වෙනත් අයට අයිති ඉඩම ද, දකුණට : ලොට් 4 ද, බස්නාහිරට : ලොට් 3, 2 සහ 1 ද, මායිම්ව එකී අංක 323 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිදෙකක (අ. 0, රූ. 0, පර්. 22) වපසරියකින් යුක්ත වන අතර, මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1630/41 දරන ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

2. මේ සමඟම මෙයට අංක 504 දරන පිඹුරේ නිරූපිත ලොට් 3එෆ් (අඩි 10 පළල පාර) මතින් පාරේ අයිතිය ද ඇත.

3. ඉහත කී පරිදි තලංගම දකුණ පිහිටි ගොඩැල්ලවත්ත පාර, අංක 29/20 හි පිහිටි ගොරකගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්. පතිරණ විසින් සාදන ලද 1985 නොවැම්බර් මස 08 දිනැති අංක 504 දරන පිඹුරෙහි ලොට් 3ඊ (පාරේ අයිතිය) ලෙස දක්වා මායිම් නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් 3ඊ, උතුරට : එම ඉඩමේ ලොට් 2 ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 6 ද, දකුණට : එම ඉඩමේ ලොට් 4 ද, බස්නාහිරට : ලොට් 3බී 3ඩී සහ 3එෆ් ද මායිම්ව අංක 504 දරන පිඹුර ප්‍රකාර පර්චස් දෙකක (අ. 0, රූ. 0, පර්. 2) වපසරියකින් යුක්ත වේ.

එකී පිඹුරු අංක 504 හි 3 පහත විස්තර කර ඇති ඉඩමෙහි සහ එයින් බෙදූ සීමා නිර්ණය කරන ලද කොටසකි.

ඉහතකී පරිදි තලංගම දකුණ පිහිටි “ගොරකගහවත්ත” නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්. පතිරණ විසින් සාදන ලද 1984 අප්‍රේල් මස 03 දිනැති අංක 323 දරන පිඹුරෙහි ලොට් 3 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම එනම්, එකී ලොට් 3 උතුරට : එකී අංක 323 දරන පිඹුරෙහි ලොට් 2 ද, නැගෙනහිරට : එකී අංක 323 දරන පිඹුරෙහි ලොට් 6 (පාරට වෙන්කළ කොටස) ද, දකුණට : එකී අංක 323 දරන පිඹුරෙහි ලොට් 4 ද, බස්නාහිරට : ඩබ්. ඒවිස් පෙරේරාගේ ඉඩම ද, මායිම්ව එකී අංක 323 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකයි පර්චස් පහයි දශම පහයි බිංදුවක (අ. 0, රූ. 1, පර්. 5.50) වපසරියකින් යුක්ත වන අතර, මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී607/199 යටතේ ලියාපදිංචි කර ඇත.

ජේ. ඒ. සුනිල්,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
කොළොන්නාව ශාඛාව.

09-111

---

### වයඹ සංවර්ධන බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බලය ලැබී ඇති පරිදි, 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී බැංකුවේ අනුප්‍රාප්තික වයඹ සංවර්ධන බැංකුවේ නීතිමය ප්‍රතිපාදන අනුව සම්මත කරන ලද යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2008.11.26 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් පහත සඳහන් අයුරු සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

#### අධ්‍යක්‍ෂ මණ්ඩල යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුව නමට ලියන ලද නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. ටී. ඒ. මාරසිංහ මහතා විසින් සහතික කරන ලද 2004.10.12 වැනි දින අංක 7897 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම හලාවත අඹකදවිල අංක 42හි පදිංචි වර්ණකුලසූරිය ඇන්ටනී මාකස් ප්‍රනාන්දු සහ හලාවත අඹකදවිල අංක 42 පදිංචි වර්ණකුලසූරිය දෝන මේරි අයිරාංගනී ප්‍රනාන්දු, හලාවත අඹකදවිල අංක 42 පදිංචි වර්ණකුලසූරිය මරියා ප්‍රනාන්දු ණයකරුවන් හා උකස්කරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ වයඹ සංවර්ධන බැංකුවට ලැබිය යුතුව ඇති රුපියල් අසූතුන් දහස් හාරසිය හැට (රු. 83,460) ක මුදලද, එකී මුදල 2008.10.17 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වර්ෂයකට සියයට විසිදෙක (22%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු

වෙනත් ගාස්තුද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩු කර, එකවර අයකර ගැනීම පිණිස ඉහත අංක 7897 දරන බැඳුම්කරය මගින් වයඹ සංවර්ධන බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

### ඉඩමේ උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කරන කොට්ඨාසය තුල උතුරු පිටිගල් කෝරලේ මුන්නේශ්වරම් පත්තුවේ අඹකදවිල කියන ගමේ පිහිටි තනිපොල්ගහවෙල හෙවත් මුදුවැල්ල හා තනිපොල්ගහවෙල කියන ඉඩමට වර්ෂ 2000 ක් වූ මාර්තු මස 1 වැනි දින එස්. ශ්‍රීධරන් අවසරලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 716 දරන සිතියම ප්‍රකාර ලොට් 1 දරන උතුරට : මිනුම්පතිගේ පී. පී. 4997 දරන පිඹුරේ සඳහන් ලොට් 1 දරන අඩි 6ක් පළල පාරකට වෙන්කල බිම ද, නැගෙනහිරට : හලාවත ඉරණවිල මහ පාරද, දකුණට : වර්නන් පෙරේරා මානක තැනගේ අංක 5029 දරන සිතියමේ ලොට් ඊ 2 දරන ජේ මයිකල්ට අයිති ඉඩමද, බස්නාහිරට : මුහුදු වෙරළට අයිති රක්‍ෂිතයද, මායිම් වූ පර්චස් තිස් නවයක් (අ. 0, රූ. 0, පර්. 39) ක් විශාල ඉඩමේ බිම හා ඊට අයිති සෑම සියලු දේත් වේ.

මෙම ඉඩම හලාවත ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ සී 151/266 යටතේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි,

ජ්. එච්. එම්. එම්. බී. ජයසිංහ,
සහකාර සාමාන්‍යාධිකාරි (අයකිරීම්).

වයඹ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 155, මීගමු පාර,
කුරුණෑගල.

09-147/7

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට බදුල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. සී. එච්. මැණිකේ විසින් ලියා සහතික කරන ලද අංක 2187 හා 2007 අගෝස්තු මස 30 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, "ලංකා ෆොටෝ" යන නාමය, අභිධානය සහ ආයතනය යටතේ අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන බදුල්ලේ, පුලට්ටු වේලායුධන් පුෂ්පකුමාර් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2008 අප්‍රේල් 01 වන දිනට, ඉහත කී අංක 2187 දරන උකස් බැඳුම්කරය මත, ඉහත කී පුලට්ටු වේලායුධන් පුෂ්පකුමාර් යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් විසිලක්ෂ හැටඑක්දහස් දෙසීය අසූපහකුත් ශත තිහක (රු.20,61,285.30) මුදලක් සහ 2008 අප්‍රේල් 01 දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහඅට ලක්ෂ අනූනවදහස් නවසිය අනූ අටක් (රු.18,99.998) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල වැඩකරන පළමු දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන විසිලක්ෂ හැටඑක්දහස් දෙසිය අසූපහකුත් ශත තිහක (රු. 20,61,285.30) මුදල සහ 2007 අගෝස්තු 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහඅට ලක්ෂ අනූනවදහස් නවසිය අනූ අටක් (රු.18,99,998) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල වැඩකරන පළමු දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකය මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තුද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2187 දරන උකස් බැඳුමකරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ශොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 2187 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල විස්තරය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල නගරයේ බදුල්ල කඩවත් අතර පීලිපොතගම පිහිටි "හීන්නාරන්ගහකුඹුර" (දැනට උස්බිම) යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකර ඉඩමේ (බලයලත් මිනින්දෝරු එම්. ෆුවාඩ් ඉස්මයිල් විසින් මැන සාදන ලද අංක 3455 හා 1988.07.09 දින දරන පිඹුරේ ලොට් අංක 3 සහ 5 දරන බිම් කොටස් ඒකාබද්ධ කර නැවත මැනීමක් වන) බලයලත් මිනින්දෝරු එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් මැන සාදන ලද අංක 1/07/2007 දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම් උතුරට : බලයලත් මිනින්දෝරු එම්. ෆුවාඩ් ඉස්මයිල් විසින් මැන සාදන ලද අංක 3455 හා 1988.07.09 දින දරන පිඹුරේ ලොට් අංක 02 සහ 04 ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එම්. ෆුවාඩ් ඉස්මයිල් විසින් මැන සාදන ලද අංක 3455 හා 1988.07.09 දින

දරන පිඹුරේ ලොට් අංක 02, 04 සහ 06 ද, දකුණට : කඳුර සහ පුංචිබණ්ඩාට අයිති කුඹුර ද, බස්නාහිරට : රාණි බටපොලගේ වත්ත සහ පුංචිබණ්ඩාගේ කුඹුර ද යන මායිම් ඇතුළත පර්චස් විසි හතරකුත් දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 24.75) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි, පීලිපොතගම පර, වරිපනම් අංක 7ඒ සහ 7 බී දරන ගොඩනැගිලි හා එහි පිහිටි හා ඊට අනුබද්ධ වෙනත් සියලු දේ. මෙයට එම පිඹුරේ ලකුණු කර තිබෙන ප්‍රවේශ මාර්ගය නිදහසේ ප්‍රායෝජනයට ගැනීමේ අයිතිවාසිකම ද ඇතුළත් වේ. මෙම ඉඩම බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරි.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

08-62/1

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

ගිණුම් අංකය : 1100022577
ණය ගිණුම් අංකය : 390250

2009 අප්‍රේල් මස 24 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී, මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. ඩී. රණගල විසින් 2006 අප්‍රේල් මස 04 වැනි දින සහතික කරන ලද අංක 457 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. පී. හේරත් විසින් 2008 දෙසම්බර් මස 05 වැනි දින සහතික කරන ලද අංක 1162 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී) හි නමට ලියන ලද්දාවූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, ලෑන්ඩ් මාර්ක් ඉන්ජිනියරිංග් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ණයකරු හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එකසිය හතලිස් හය ලක්ෂ අසූ දෙදහස් තුන්සිය තිස් හතයි සත හැට හයක (රු.146,82,337.66) මුදලක් 2008 දෙසැම්බර් මස 31 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී යට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එකසිය හතලිස් හය ලක්ෂ අසූ දෙදහස් තුන්සිය තිස් හතයි සත හැට හයක (රු.1,46,82,337.66) මුදලට 2009 ජනවාරි මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් තිස්නව ලක්ෂ පනස් අට දහස් පන්සිය අසූවක (රු.39,58,580.00) මුදල මත 26%ක වැඩිපුර වාර්ෂික පොළිය සහ රුපියල් අනූ අට ලක්ෂ හැට හයදහස් හයසිය දහඅටයි සත අනූ දෙකක (රු.98,66,618.82) මුදල මත 36% ක වැඩිපුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩු කොට එකී අංක 457සහ 1162 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ස්ඩෝර්ප් වීදිය, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බලයලත් මානක පී. පරරාස සේගරම් විසින් 2005 මැයි මස 15 වැනි දින මැන සාදන ලද අංක 2518 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පල්ලේ පත්තු සල්පිටි කෝරළේ කොළඹ මහ නගර සභා සීමාව තුළ වැල්ලවත්තේ පිහිටි මාදන්ගහවත්ත පටුමගේ වරිපනම් අංක 06 දරන ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වූ (වැල්ලවත්ත ලියාපදිංචි අංක 2 දරන පිඹුරේ ලොට් 3660 වශයෙන් පෙන්වා ඇති ඉඩමේ නැවත බෙදීමක් වන) සියඹලාගහවත්ත කියන ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 7119 ට මායිම් : උතුරට : මාදන්ගහවත්ත පටුමගද, නැගෙනහිරට : මාදන්ගහවත්ත පටුමගෙහි වරිපනම් අංක 8 දරන ලොට ඩී ද, දකුණට : (මාදන්ගහවත්ත පටුමගේ වරිපනම් අංක 04 දරන) ලොට් බී ද, බස්නාහිරට : මාදන්ගහවත්ත පටුමග ද යන මායිම් තුළ අංක 2518 දරන පිඹුර පරිදි පර්චස් දහයයි දශම දෙකයි අටක් (අ. 0, රූ. 0, පර්. 10.28) විශාල ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වැල්ල 176/62 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචි වී ඇත.

වඩාත් නිවැරදි ලෙස මෙසේ පෙන්වා ඇත.

බලයලත් මානක පී. පරරාස සේගරම් විසින් 2006 ජනවාරි මස 10 වැනි දින සාදන ලද අංක 2601 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පල්ලේ පත්තුවේ සල්පිටි කෝරළේ කොළඹ මහ නගර සභා සීමාව තුළ වැල්ලවත්තේ පිහිටි මාදන්ගහවත්ත පටුමගේ වරිපනම් අංක 6 දරන ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වූ සියඹලාගහවත්ත කියන ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 7380 ට මායිම්, උතුරට : මාදන්ගහවත්ත පටුමග සහ ලොට් 7381 ද, නැගෙනහිරට : මාදන්ගහවත්ත පටුමගෙහි වරිපනම් අංක 8 දරන ලොට් ඩී ද, දකුණට : (මාදන්ගහවත්ත පටුමගේ වරිපනම් අංක 04 දරන) ලොට් බී ද, බස්නාහිරට : මාදන්ගහවත්ත පටුමග සහ ලොට් 7381 ද යන මායිම් තුළ අංක 2601 දරන පිඹුර පරිදි පර්චස් දහයයි දශම දෙකයි තුනක් (අ. 0, රූ. 0, පර්. 10.23) විශාල ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වැල්ල 179/189, 190 වෙළුමේ/පිටු යටතේ ලියාපදිංචි වී ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

09-84

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය : පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

ණය ගිණුම් අංකය : 127930
ගිණුම් අංකය : 1490002026

2009 මාර්තු මස 24 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. ගමගේ විසින් 2002 මාර්තු මස 11 වැනි දින සහතික කරන ලද අංක 1456 දරන බැඳුම්කරය සහ 2002 අප්‍රේල් මස 10 වැනි දින සහතික කරන ලද අංක 1497 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඞ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.) හි නමට ලියන ලද්දා වූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රත්නපුර කුඩුගල්වත්ත අංක 12 යන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන සමාගම් ආඥාපනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වූ fපයිව් ඒකර් ෆාම්ස් (ප්‍රයිවට්) ලිමිටඞ් සමාගම ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හැත්තෑලක්ෂ හතලිස් නවදහස් හයසිය දහසයයි ශත තිස්පහක (රු.7,049,616.35) මුදලක් 2008 දෙසැම්බර් මස 5 වැනි දින වනවිට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හැත්තෑලක්ෂ හතලිස් නවදහස් හයසිය දහසයයි ශත තිස්පහක (රු.7,049,616.35) මුදලට 2008 දෙසැම්බර් මස 06 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 3,181,550 ක මුදල මත 20% ක වැඩිදුර වාර්ෂික පොලියද, ප්‍රචාරක වියදම සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 1456 සහ 1497 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී වෙත උකස්කොට ඇත්තාවූද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ප්ස්ඩොප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බලයලත් මානක සිරි. ඩී. ලියනසූරිය විසින් 1999 අගෝස්තු මස 07 වැනි දින සාදන ලද අංක 7154 දරන පිඹුර පරිදි, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු හේවාගම් කෝරළේ, තලංගම ඒකකයෙහි, බත්තරමුල්ල, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ බත්තරමුල්ල පිහිටි දෙල්ගහවත්ත ඉඩමේ ගොඩනැගිලි සහ සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් ඒබී 1 දරන කොටසට මායිම් : උතුරට : අළුත් පාර ද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 2 ද, දකුණට : අංක 2550 දරන පිඹුරේ ලොට් "බී" ද, බස්නාහිරට : ජෝන් පියදාසට සහ තවත් අයට හිමි ඉඩම ද, යන මායිම් තුළ පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම.

ඉහත කී ලොට් "ඒබී1" පහත සඳහන් ඉඩම් හා ඒකාබද්ධව ඇත.

බලයලත් මානක සී. ද එස්. ගුණතිලක විසින් 1997 අප්‍රේල් මස 28 වැනි දින සාදන ලද අංක 2550 දරන පිඹුර පරිදි එකී බත්තරමුල්ල පිහිටි දෙල්ගහවත්ත කියන ඉඩමේ පිහිටි ගොඩනැගිලි සහ සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් බී 1 දරන ඉඩමට මායිම්, උතුරට : බලයලත් මානක සී. ද. එස්. ගුණතිලක විසින් 1993 ජුනි මස 15 වැනි දින සාදන ලද අංක 2075 දරන පිඹුරේ ලොට් "ඒ" ද, නැගෙනහිරට : අංක 688 දරන පිඹුරේ ලොට් 2 ද, දකුණට : ලොට් "බී2" ද, බස්නාහිරට : ජෝන් පියදාසට සහ තවත් අයට අයිති ඉඩම ද, යන මායිම් තුළ අංක 2550 දරන පිඹුර පරිදි පර්චස් දෙකයි දශම හයයි හයක් (අ. 0, රූ.0, පර්. 2.66) විශාල ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 909/249 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචි වී ඇත.

බලයලත් මානක සී. ද එස්. ගුණතිලක විසින් 1993 ජුනි මස 15 වැනි දින සාදන ලද අංක 2075 දරන පිඹුර පරිදි එකී බත්තරමුල්ල පිහිටි දෙල්ගහවත්ත ඉඩමේ පිහිටි ගොඩනැගිලි සහ සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් "ඒ" දරන ඉඩමට මායිම් : උතුරට : අළුත් පාර ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 2 ද, දකුණට : ලොට් "බී" ද, සහ බස්නාහිරට : ජෝන් පියදාසට සහ තවත් අයට හිමි ඉඩම ද, යන මායිම් තුළ එකී අංක 2075 දරන පිඹුර පරිදි පර්චස් හතයි දශම තුනයි හතරක් (අ. 0, රූ. 0, පර්. 7.34) විශාල ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ඒ909/231 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

09-86

---

### පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - මීගමුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.07.22 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

එනම්, ජයසේකර මුදලිගේ ස්වර්ණ මාධව ජයසේකර සහ සිල්පාචාරිගේ තුසී අමල් සිල්වා බන්ධනදායියන් වශයෙන් සහ සිල්පාචාරිගේ තුසී අමල් සිල්වා උකස්කරු වශයෙන් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඞ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඞ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට සියල්ලම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් ලියා සහතික කරන ලද අංක 1393 සහ 2004.08.31, අංක 1615 සහ 2005.04.01, අංක 2117 සහ 2006.06.29, අංක 2301 සහ 2007.02.27, අංක 2401 සහ 2007.07.19 සහ අංක 2691 සහ 2008.10.13 දිනැති උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක්-

(i) 2009.05.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් එකොළොස් ලක්ෂ විසිහත් දහස් හත්සිය තිස් දෙකයි ශත අසූ එක (රු. 11,27,732.81)ක මුදල සහ 2009.06.01 වැනි දින සිට රුපියල් දස ලක්ෂය (රු. 10,00,000) ක මුදල මත වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් පොලිය ද, සහ රුපියල් දස ලක්ෂයක (රු. 10,00,000) ඉක්මවන මුදල මත වර්ෂයකට සියයට විසිනමය (29%) බැගින් පොලිය ද, සහ

(ii) 2009.06.11 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් දෙලක්ෂ හතලිස් හත්දහස් තුන්සිය තුනයි ශත අසූහය (රු. 2,47,303.86) ක මුදල සහ 2009.05.22 වැනි දින සිට රුපියල්

දෙලක්ෂ හතලිස් එක් දහස් නමසිය පනස් දෙක (රු. 2,41,952) ක මුදල මත වර්ෂයකට සියයට තිහ (30%) බැගින් පොළිය ද, සහ

(iii) 2009.06.23 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් දාහතර ලක්ෂ නම දහස් හයසිය හයයි ශත හතලිස් හත (රු. 14,09,606.47) ක මුදල සහ 2009.06.24 වැනි දින සිට රුපියල් දහතුන් ලක්ෂ හැත්තෑ අටදහස් නමසිය තිහ (රු. 13,78,930) ක මුදල මත වර්ෂයකට සියයට විසිනමය (29%) බැගින් පොළිය ද,

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ, ඒ කෙසේද යත්-

එකී අංක 1393, 1615, 2117, 2301, 2401 සහ 2691 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් විසි හත්ලක්ෂ අසූහතර දහස් හයසිය හතලිස් තුනයි ශත දාහතර (රු. 27,84,643.14)ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද අංක 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 9හි පිහිටි එම්. එස්. ඔක්ෂන්ස්හි බලයලත් වෙන්දේසිකරු ශ්‍රියාණි මනම්පේරි වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය පරිදි අධිකාරිය සහ බලය පවරන ලෙස ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, රාගම් පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ කොටුගොඩ පිහිටි දැනට කොටුගොඩ පාරේ, වරිපනම් අංක 297/ඒ දරන අඹගහවත්ත නමැති ඉඩමට (බලයලත් මානක පී. එම්. නෝනිස් විසින් මැන සාදන ලද අංක 6262 සහ 1973.07.05 දින දරන සැලැස්මේ ලොට් 1 දරන බිම් කැබැල්ලේ යළි මැනුමක් වන) බලයලත් මානක එම්. ඩී. එන්. ටී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 3166 සහ 2004 ජූලි 24 දිනැති සැලැස්මේ ලොට් අංක 1 වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : එස්. සුලින් ශාන්ත ප්‍රනාන්දුට හිමි මෙම ඉඩමේම කොටසක්, නැගෙනහිරට : දැනට එස්. එස්. සිල්වා සහ කේ. අමරජීවට අයත් ඉඩම්, දකුණට : අනිල් ප්‍රනාන්දුට අයත් මෙම ඉඩමේම ලොට් 2 සහ පාර සහ බස්නාහිරට : එස්. සුනිල් ශාන්ත ප්‍රනාන්දුට අයත් මෙම ඉඩමේම කොටසක් යන මායිම් තුළ පිහිටි පර්චස් විසි නමයයි දශම දෙකයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 29.20) ක් හෝ හෙක්ටයාර් 0.0738ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ වැවිලි ආදී සියල්ල වේ. මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පිටුව බී 216/43හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනීත ආරියනන්ද,
කළමනාකරු- ණය අයකර ගැනීම්.

09-193/4

### සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1069 5001 4310.

2007 අගෝස්තු මස 30 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුනු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හෝමාගම කන්දලන්ද ශ්‍රී ලංකා යුද හමුදාවේ විවාහක නිල නිවාස අංක 5C - 50 හි පදිංචි කපිල චානක ප්‍රතාපසිංහ, සූරියගමගේ සමන්තිකා පෙරේරා සහ සූරියගමගේ ෂෙල්ටන් පෙරේරා යන අය බන්ධනදායීන් වශයෙන් සහ ඉහත කී හෝමාගම, කන්දලන්ද ශ්‍රී ලංකා යුධ හමුදාවේ විවාහක නිල නිවාස අංක 5C- 50 හි පදිංචි සූරියගමගේ ෂෙල්ටන් පෙරේරා යන අය උකස්කරු වශයෙන් කොළඹ බලයලත් මිනින්දෝරු ටී. එම්. ආර්. සේනානායක විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2005 අප්‍රේල් මස 04 දාතම හා අංක 419 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 මැයි මස 08 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දසලක්ෂ තිස්එක් දහස් හයසිය පනස් එකකුත් ශත හැත්තෑතුනක් (රු. 10,31,651.73ක් පමණයි) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් දසලක්ෂ තිස්එක් දහස් හයසිය පනස් එකකුත් ශත හැත්තෑ තුනක (රු. 10,31,651.73ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් දසලක්ෂ හත්දහස් දොළහකුත් ශත හැත්තෑ අටක (රු. 10,07,012.78ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දොළහයි දශම පහ (12.5%) බැගින් 2007 මැයි මස 09 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 419 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මිරිහානේ පිහිටි දැනට පරණ කොට්ටාව පාරේ, වරිපනම් අංක 53/15 දරන මිල්ලගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඒ. ආර්. සිල්වා විසින් සාදන ලද 1999 සැප්තැම්බර් මස 26 දාතම හා අංක 778 දරන පිඹුරේ ලොට් 3B2 වශයෙන් ලකුණු කොට නිරූපිත ගල්කිස්ස ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව M2426/99හි ලියාපදිංචි කොට ඇති එකී අංක 778 පිඹුරට අනුව, උතුරට : නාලිනි ලියනගේගේ ඉඩම ද, නැගෙනහිරට : අංක 2892 පිඹුරේ ලොට් 3B1 ද, දකුණට : ඊ. අර්නස්ට් පෙරේරාගේ ඉඩම ද සහ බටහිරට : පාර ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දාහතරයි දශම දෙකයි බිංදුවක් (අ. 0,

රූ, 0, පර්. 14.20) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ ඉඩම එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-165/3

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගනු ලැබූ සම්මුතිය

ගිණුම් අංකය : 0026 1000 0498.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009ක් වූ මැයි මස 14 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී :

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග අය විසින් ලියා සහතික කරන ලද 2003 ජූලි මස 04 දාතම හා අංක 931 සහ ආර්. ජී. ඩී. සුනාරි යන අය විසින් සහතික කරන ලද 2004 දෙසැම්බර් මස 01 දාතම හා අංක 253 සහ ආර්. අලෙන්ද්‍ර යන අය විසින් සහතික කරන ලද 2006 ජූලි මස 07 දාතම හා අංක 1566 සහ සී. ජී. බණ්ඩාර යන අය විසින් සහතික කරන ලද 2007 අප්‍රේල් මස 27 දාතම හා අංක 592 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "සිසිර ග්‍රයින්ඩින් මිල්ස් " යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ වාද්දුව, දුම්රිය පාර, මහජන වෙළඳ සැල හි කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන හෙවනහෙන්නදිගේ ගුණරුවන් සිසිර ප්‍රනාන්දු යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තිස් දෙලක්ෂ හැට දෙදහස් හත්සිය අනූ හයයි ශත අසූ අටක (රු. 32,62,796.88) මුදලක් 2009 පෙබරවාරි මස 18 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තිස් දෙලක්ෂ හැට දෙදහස් හත්සිය අනූ හයයි ශත අසූ අටක (රු. 32,62,796.88) මුදල ද 2009 පෙබරවාරි 19 වැනි දින සිට අංක 931, 253, 1566 සහ 592 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසිනමලක්ෂ පහළොස් දහස් හත්සියයක (රු. 29,15,700) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහනමයක් (19%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වේතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 931, 253, 1566 සහ 592 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය දරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

**ඉහත කී උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, තොටමුණේ, පානදුර වාද්දු වස්කඩු දෙබැද්ද වාද්දුව උප කාර්යාලය, පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ වාද්දුව බටහිර වෝඩ් අංක 07හි පිහිටි පල්ලිය පාර වරිපනම් අංක 15/5 දරන "මුදිල්ලගහවත්ත නොහොත් ගොඩකන්දමුදිල්ලගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. ඩී. එෆ්. ඒ. ෆොන්සේකා විසින් සාදන 1994 ජූලි මස 26 දාතම හා අංක 1272 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 6 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 5 (පාර), නැගෙනහිරට : මෙහි ලොට් 7, දකුණට : පයාරුගහවත්ත සහ බස්නාහිරට : දුම්රිය මාර්ගය දිගේ වෙන් කිරීම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම හතක් පහයි (අ. 0, රූ. 0, පර්. 15.75) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 1272ට අනුව වෙළුම/පත්ඉරුව ජී 159/241හි පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-165/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 1031 5008 6632.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008ක් වූ අගෝස්තු මස 28 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී :

දැන් සම්පත් බැංකුව පීඑල්සී යනුවෙන් හඳුන්වනු ලබන සීමාසහිත සම්පත් බැංකුව (සමාගම් අංක පීකිව් 144 යටතේ ලියාපදිංචි කොට ඇත) නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග විසින් ලියා සහතික කරන ලද ලද 2005 ජූනි මස 01 දාතම හා අංක 2160 උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ මොරටුව, විල්ලෝරවත්ත, බෝධිරාජ මාවත, අංක 30/4හි පදිංචි මහමරක්කලගේ නිමාලි මන්ජුලා ඩයස් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දසලක්ෂ විසි දෙදහස් හත්සියයයි ශත අනූ තුනක් (රු. 10,22,700.93) ක මුදලක් 2008 ජූනි මස 25 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දසලක්ෂ විසි දෙදහස් හත්සියයයි ශත අනූතුනක (රු. 10,22,700.93) මුදල ද 2008 ජූනි මස 26 වැනිදා සිට අංක 2160 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙත් රුපියල් නමලක්ෂ පනස් එක් දහස් හත්සිය අසූතුනයි ශත තිස්දෙකක (රු. 9,51,783.32) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනක් (13%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු

ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 2160 දරන එකී බැඳුම්කර මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුව සල්පිටි කෝරළයේ, මොරටුව මහ නගර සභා සීමාවන් තුළ විල්ලෝරාවත්ත පිහිටි බෝධිරාජ මාවත, වරිපනම් අංක 30/4 දරන "දෙල්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. ඩබ්ලිව්. ඒ. ද සිල්වා විසින් සාදන ලද 2005 ජනවාරි මස 18 දාතම හා අංක 2052 පිඹුරේ ලොට් 2සී2 වශයෙන් නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර අඩි 10 පළල (පිඹුරු අංක 261හි ලොට් 2බී සහ පිඹුරු අංක 1379 හි ලොට් 4) නැගෙනහිරට : එච්. ඒ. ඩයස් යන අයට අයිති මෙම ඉඩමෙන් කොටසක්, දකුණට : ඩබ්ලිව්. ඒ. ර්. ප්‍රනාන්දු යන අයට අයත් මෙම ඉඩමෙන් කොටසක් සහ බස්නාහිරට : ලොට් 2 සී 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම හයයි හතරක් (අ. 0, රූ. 0, පර්. 7.64)ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, පරවශ්‍යතාවන්, ප්‍රවශතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් අංක 2052 එකී පිඹුරට අනුව වෙළුම/පිටුව එම් 1488/286හි ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 1379 දරන එකී පිඹුරේ ලොට් 4 සහ අංක 261 පිඹුරේ ලොට් 2බී මතින් හා ඒවා දිගේ මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-165/2

---

### පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - මොරටුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.07.22 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, ආර්. එම්. ඩී. පැකේජිං හි තනි අයිතිකරු වන හඳුන්කුට්ටිහෙට්ටිගේ දොන් ඩිලාන් ජගත් විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට පානදුර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඩී. එස්. ෆොන්සේකා විසින් ලියා සහතික කරන ලද අංක 2464 සහ 2008 ජනවාරි මස 21 වැනි දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද, එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දිනය තෙක්,

(i) 2008.10.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හාරලක්ෂ විසිතුන් දහස් හැත්තෑඅටයි ශත හැත්තෑහතර (රු. 4,23,078.74)ක මුදල සහ 2008.11.01 වැනි දින සිට රුපියල් හාර ලක්ෂය (රු. 4,00,000) ක මුදල මත වර්ෂයකට සියයට විසිපහ (25%) බැගින් පොළිය ද, සහ රුපියල් හාර ලක්ෂයක (රු. 4,00,000) ඉක්මවන මුදල මත වර්ෂයකට සියයට තිස්අට (38%) බැගින් පොළිය ද,

(ii) 2008.11.18 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හාරලක්ෂ හැටහත් දහස් හයසිය දෙකයි ශත තිහක (රු. 4,67,602.30) ක මුදල සහ 2008.10.28 වැනි දින සිට රුපියල් හාරලක්ෂ හතලිස් දහස් එකසියය හැත්තෑ නමයයි ශත අසූපහ (රු. 4,40,179.85) ක මුදල මත වර්ෂයකට සියයට විසිනමය (29%) බැගින් පොළිය ද,

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ, ඒ කෙසේද යත්

එකී අංක 2464 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් අටලක්ෂ අනූ දහස් හයසීය අසූඑකයි ශත හතර (රු. 8,90,681.04)ක මුදල සහ ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, බැද්දගාන පාරේ, අංක 134හි පදිංචි බලයලත් වෙන්දේසිකරු. පී. කේ. ඊ. සේනාපති වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) නතේ 04 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ, කුඹුකේ පත්තුවේ, මූණගම පිහිටි බලයලත් මානක එස්. ජී. රණසිංහ විසින් මැන සාදන ලද අංක 1479 සහ 2002 නොවැම්බර් මස 11 දිනැති සැලැස්මේ දැක්වෙන පත්තියේ මූකලාන හෙවත් පත්තියේවත්ත නමැති ඉඩමේ ලොට් 91 වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : අංක 1479 සැලැස්මේ ලොට් 92, නැගෙනහිරට : අංක 1272 සැලැස්මේ ලොට් බී1බී (එල්. බී. ෆිනෑන්ස් සමාගම් ඉඩම) දකුණට : අංක 1479 සැලැස්මේ ලොට් 90 සහ බස්නාහිරට : අංක 1479 සැලැස්මේ ලොට් 107 යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහ (අ. 0, රූ. 0, පර්. 12) ක් හෝ හෙක්ටයාර් 0.03035ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සියලු දේද වේ. හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පිටුව සී 214/266හි ලියාපදිංචි කර ඇත.

එකී අංක 1479 සැලැස්මේ ලොට් 107 සහ ලොට් 13 මත මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනිත ආරියනන්ද,
කළමනාකරු- ණය අයකර ගැනීම්.

09-193/3

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - කිරුළපන ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.06.24 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, සිලෝන් පැකේජිං සමාගමේ තනි අයිතිකරු වන නිසාන් ඇන්ඩෲ මරියනායගම් විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. කනේෂයෝගන් විසින් ලියා සහතික කරන ලද අංක 1867 සහ 2008 මාර්තු මස 17 වැනි දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දිනය තෙක්,

(i) 2009.04.30 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් පන් ලක්ෂ තිස්තුන් දහස් හාරසිය තිස් හතයි ශත හැත්තෑ තුන (රු. 5,33,437.73)ක මුදල සහ 2009.05.01 වැනි දින සිට රුපියල් පන් ලක්ෂය (රු. 5,00,000) ක මුදල මත වර්ෂයකට සියයට විසිපහ (25%) බැගින් පොළිය ද, සහ රුපියල් පන් ලක්ෂය (රු. 5,00,000) ඉක්මවන මුදල මත වර්ෂයකට සියයට විසිනමය (29%) බැගින් පොළිය ද,

(ii) 2009.04.30 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් විසිඑක් ලක්ෂ පනස් නම දහස් එකසිය හැට තුනයි ශත පනස් දෙක (රු. 21,59,163.52) ක මුදල සහ 2009.05.01 වැනි දින සිට රුපියල් විසිලක්ෂය (රු. 20,00,000) ක මුදල මත වර්ෂයකට සියයට විසිපහ (25%) බැගින් පොළිය ද, සහ රුපියල් විසිලක්ෂය (රු. 20,00,000) ඉක්මවන මුදල මත වර්ෂයකට සියයට විසිනමය (29%) බැගින් පොළිය ද,

(iii) 2009.05.26 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හාරලක්ෂ විසිනම දහස් එකසිය හැත්තෑ දෙකයි ශත හතක (රු. 4,29,172.07) මුදල සහ 2009.05.27 වැනි දින සිට රුපියල් තුන්ලක්ෂ අනූ එක් දහස් හැත්තෑ දෙකයි ශත එක (රු. 3,91,072.01) ක මුදල මත වර්ෂයකට සියයට විසිඅට (28%) බැගින් පොළිය ද, සහ

(iv) 2009.05.26 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හතලිස් හත්ලක්ෂ අසූතුන් දහස් එකසිය හැත්තෑ දෙකයි ශත හැත්තෑ එක (රු. 47,83,172.71) ක මුදල සහ 2009.05.27 වැනි දින සිට රුපියල් හතලිස් තුන්ලක්ෂ දහතුන් දහස් හත්සිය පනහක (රු. 43,13,750) මුදල මත වර්ෂයකට සියයට විසි නමය (29%) බැගින් පොළිය ද, සහ

(v) 2009.05.26 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් විසිලක්ෂ හතලිස් හයදහස් හයසිය හතලිස් දෙකයි ශත විසිදෙකක (රු. 20,46,642.22) මුදල සහ 2009.05.27 වැනි දින සිට රුපියල් දහඅටලක්ෂ හතලිස් අට දහස් හත්සිය පනහ (රු. 18,48,750) ක මුදල මත වර්ෂයකට සියයට විසිනමය (29%) බැගින් පොළිය ද,

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ, ඒ කෙසේද යත්

එකී අංක 1867 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් අනූ නමලක්ෂ පනස් එක් දහස් පන්සිය අසූ අටයි ශත විසිපහක (රු. 99,51,588.25) මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද අංක 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, බැද්දගාන පාරේ, අංක 134හි පදිංචි බලයලත් වෙන්දේසිකරු. පී. කේ. ඊ. සේනාපති වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, කොළඹ මහ නගර සභාවේ අද්මිනිස්ත්‍රාසි බල ප්‍රදේශය තුළ බම්බලපිටිය කොට්ඨාස අංක 38හි කොල්ලුපිටියේ 10 වැනි පටුමග හරහා පාරේ කොළඹ 3, කොල්ලුපිටිය 10 වැනි පටුමග වරිපනම් අංක 15/6 දරන බලයලත් මානක කේ. කේ. තිරුනාවුකරසු විසින් මැන සාදන ලද අංක 1707/ටී සහ 1974.10.01 දිනැති සැලැස්මේ ලොට් 3ඒ සහ 3බී යන ඉඩම් කැබලි දෙක (මැරයින් ඩ්‍රයිව් මාර්ගය පුළුල් කිරීම සඳහා ඉවත දමන ලද බලයලත් මානක ජී. කේ. සමරසිංහ විසින් මැන සාදන ලද අංක 98/196 සහ 1999.11.19 දිනැති ප්‍රගමන අනුරේඛනයේ 35 දරන කැබැල්ල හැර) ඒකාබද්ධ කොට යළි මනින ලද බලයලත් මානක කේ. සෙල්වරත්නම් විසින් මැන සාදන ලද අංක 9496 සහ 2001.07.24 දිනැති සැලැස්මේ ලොට් 3X වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති උතුරට : කොල්ලුපිටිය පාරේ වරිපනම් අංක ජී586 දරන පරිශ්‍රය, නැගෙනහිරට : අංක 1707/ටී සැලැස්මේ ලොට් 3සී බිම් කැබැල්ල, දකුණට : ලොට් X දරන පුද්ගලික පාර සහ බස්නාහිරට : මැරයින් ඩ්‍රයිව් (වීරීරේබා සීමාව තුළ ඉඩම) යන මායිම් තුළ පිහිටි එකී අංක 9496 සැලැස්ම අනුව පර්චස් පහයි දශම අටයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 5.80) ක් හෝ හෙක්ටයාර් 0.01467 හෝ වර්ග මීටර් 146.7ක් විශාල ඉඩම. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පිටුව ඒ 1039/42හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක එස්. විජයරත්නම් විසින් මැන සාදන ලද අංක 71/1973 සහ 1973.12.30 දිනැති සැලැස්මේ ලොට් 4 මත මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනීත ආරියනන්ද,
කළමනාකරු- ණය අයකර ගැනීම්.

09-193/2

### වයඹ සංවර්ධන බැංකුව

දේපළ වෙන්දේසි කිරීමේ යෝජනා කෙටුම් පත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බලය ලැබී ඇති පරිදි, 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී බැංකුවේ අනුප්‍රාප්තික වයඹ සංවර්ධන බැංකුවේ නීතිමය ප්‍රතිපාදන අනුව සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.12.24 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුව නමට ලියන ලද නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එච්. එම්. නලින් චන්දන අබේරත්න මහතා විසින් සහතික කරන ලද 2003.11.12 වැනි දින අංක 833 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කොට්ටුකච්චිය, අමුණුවැව හි පදිංචි වර්ණකුලසූරිය රේමන්ඩ් අගස්ටස් ණයකරු හා උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ වයඹ සංවර්ධන බැංකුවට ලැබිය යුතුව ඇති රුපියල් හැත්තෑහතර දහස් එකසියය (රු. 74,100) ක මුදල ද, එකී මුදලට 2003.12.18 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වර්ෂයකට සියයට විසිතුන (23%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර, එකවර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 833 දරන බැඳුම්කරය මගින් වයඹ සංවර්ධන බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී. සී. පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ, ආනමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පෙරවිලි පත්තුවේ/කෝරළේ, අංක 649ඒ විහාරගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ගල්වාන නමැති ගමේ පිහිටි ඇත්තා වූ ද, භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත ක්ෂේත්‍ර පත්‍රයෙහි සම්පාදිත අංක දරන කට්ටි කැඩීමේ පිඹුරේ රේඛා සටහනේ අංක දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර දෙකක් (02) රූඩ් නැත (0) පර්චස් නැත (0) පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම, බ. ප. අ. 90/4594 උතුරට : සෝමරත්නගේ ඉඩම ද, නැගෙනහිරට : කිරිවැව ද, දකුණට : වික්ටර් පෙරේරාගේ ඉඩම ද, බස්නාහිරට : පැන්ටලින් පෙරේරාගේ ඉඩම ද, (අංක දරන පිඹුරු/අංක දරන කට්ටි කැඩීමේ පිඹුර/අංක දරන රේඛා සටහන අමුණා ඇත.)

ඉහත ඉඩම ඩබ්ලිව්. ඒ. සිරිසේන බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 1462 සහ 2003.08.21 දින දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් අක්කර දෙකක්, රූඩ් නැත, පර්චස් නැත (අ. 2, රූ. 0, පර්. 0) විශාල ඉඩමට මායිම් වනුයේ, උතුරට : සෝමරත්න හිමිකම් කියන ඉඩම සහ කිරිවැව ද, නැගෙනහිරට : කිරිවැව සහ වික්ටර් පෙරේරා හිමිකම් කියන ඉඩම ද, දකුණට : පැන්ටලින් පෙරේරා හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : පැන්ටලින් පෙරේරා හිමිකම් කියන ඉඩම සහ සෝමරත්න හිමිකම් කියන ඉඩම ද, වන සහ ඊට අයත් සෑම ආකාර සියලු දේත් වේ.

මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/106/78 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. එච්. එම්. එම්. බී. ජයසිංහ,
සහකාර සාමාන්‍යාධිකාරී - අයකිරීම්.

වයඹ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 155, මීගමු පාර,
කුරුණෑගල.

09-147/3

---

### වයඹ සංවර්ධන බැංකුව

දේපළ වෙන්දේසි කිරීමේ යෝජනා කෙටුම් පත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බලය ලැබී ඇති පරිදි, 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී බැංකුවේ අනුප්‍රාප්තික වයඹ සංවර්ධන බැංකුවේ නීතිමය ප්‍රතිපාදන අනුව සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.12.24 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුව නමට ලියන ලද නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එච්. එම්. නලින් චන්දන අබේරත්න මහතා විසින් සහතික කරන ලද 2004.01.09 වැනි දින අංක 891 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ආනමඩුව, දිවුල් වැව හි පදිංචි අලුත්වත්ත මුදියන්සේලාගේ චමින්ද සේනාරත්න ණයකරු හා උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ වයඹ සංවර්ධන බැංකුවට ලැබිය යුතුව ඇති රුපියල් පනස් එක්දහස් හත්සිය තිහ (රු. 51,730) ක මුදල ද, එකී මුදලට 2008.05.30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වර්ෂයකට සියයට දහනවය (19%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර, එකවර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 891 දරන බැඳුම්කරය මගින් වයඹ සංවර්ධන බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ

පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී. සී. පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

### ඉඩමේ උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, ආනමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පාඩිතා පත්තුවේ, කෝරළයේ, අංක 658 සී දිවුල් වැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, දිවුල් වැව නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, බිම් කැබැල්ල ප්‍රමාණයෙන් අක්කර එක (අ. 1, රූ. 0, පර්. 0) පමණ විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම (බ. ප. අංක 90/3413) උතුරට : සුනිල් පත්මසිරිගේ ඉඩම ද, නැගෙනහිරට : අලුත් වැව පාර ද, දකුණට : කේ. සේතුවාගේ ගොඩ ඉඩම ද, බස්නාහිරට : ඩබ්. කීර්තිරත්නගේ ඉඩම.

ඉහත ඉඩම පොත් තංගවව්වේලු මානක තැන විසින් මැන සාදන ලද අංක 2645 හා 2003.07.01 දිනැති පිඹුරට අනුව ප්‍රමාණයෙන් අක්කර එක (අ. 1, රූ. 0, පර්. 0) පමණ විශාල ඉඩමට මායිම් වනුයේ උතුරට : පාර ද, නැගෙනහිරට : ඉතිරි ඉඩම ද. දකුණට : කේ. සේතුවාගේ ඉඩම ද, බස්නාහිරට : පාර ද, ලෙස මායිම්වන ඉඩම සහ ඊට අයත් සෑම සියලු දේත් වේ.

මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/207/151 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. එච්. එම්. එම්. බී. ජයසිංහ,
සහකාර සාමාන්‍යාධිකාරී - අයකිරීම්.

වයඹ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 155, මීගමු පාර,
කුරුණෑගල.

09-147/2

---

### වයඹ සංවර්ධන බැංකුව

### දේපළ වෙන්දේසි කිරීමේ යෝජනා කෙටුම්පත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බලය ලැබී ඇති පරිදි, 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී බැංකුවේ අනුප්‍රාප්තික වයඹ සංවර්ධන බැංකුවේ නීතිමය ප්‍රතිපාදන අනුව සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.04.29 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රාදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුව නමට ලියන ලද නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එච්. එච්. ජයසිංහ මහතා විසින් සහතික කරන ලද 2007.06.05 වැනි දින අංක 11005 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම මාරවිල තැපැල් පල්ලිය පාර හි පදිංචි මිහිඳුකුලසූරිය මේරියන් නිමාලි පින්තු ණයකරු හා උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ වයඹ සංවර්ධන බැංකුවට ලැබිය යුතුව ඇති රුපියල් නවලක්ෂ හතලිස් තුන්දහස් දෙසිය එකොළහ (රු. 9,43,211) ක මුදල ද, එකී මුදලට 2009.03.13 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර, එකවර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 11005 දරන බැඳුම්කරය මගින් වයඹ සංවර්ධන බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී. සී. පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

### ඉඩමේ උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් දකුණු පිටිගල් කෝරළේ යටකලන් පත්තුවේ මාරවිල පිහිටි පරගහයාය, දිවුල් ගහ වත්ත කියන ඉඩමෙන් වර්ෂ 1999.06.10 වැනි දින එම්. එම්. පී. ඩන්ස්ටන් පෙරේරා බලයලත් මිනින්දෝරු තැන මැන සාදන ලද අංක 2797 දරන සිතියමේ ප්‍රකාර බෙදූ ලොට් 01 දරන කොටසට මායිම්, උතුරට : මයිකල් ඩෙන්වර් ප්‍රනාන්දු බලයලත් මානක තැන 1973.05.22 දින මැන සාදන ලද 2341ඒ දරන ලොට් 07 දරන කොටස වන ඩොනල්ගේ ඉඩම් ද, නැගෙනහිරට එකී පිඹුරේ සඳහන් නිවෙස්වල සිට පල්ලිය පාර තෙක් වැටී තිබෙන පාර ද, දකුණට : ඉහත කී අංක 08 දරන කොටසට ඉතිරි කොටස වන අංක 1504/96 දරන පිඹුරේ ලොට් 01 දරන පියදාසගේ ඉඩම ද, බස්නාහිරට : අයිරින් තිසේරාගේ ඉඩම ද මායිම් වන පර්චස් තිස් දෙකක් (අ. 0, රූ. 0, පර්. 32) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයිති ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සහ ඉහත කී අංක 2341ඒ දරන සිතියමේ ලොට් 12 දරන බිම් තීරය පාරක් වශයෙන් පොදුවේ පාවිච්චි කිරීමේ අයිතිවාසිකමත් සමග වේ.

මෙම ඉඩම මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K57/164 යටතේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. එච්. එම්. එම්. බී. ජයසිංහ,
සහකාර සාමාන්‍යාධිකාරී - අයකිරීම්.

වයඹ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 155, මීගමු පාර,
කුරුණෑගල.

09-147/6

### වයඹ සංවර්ධන බැංකුව

### දේපළ වෙන්දේසි කිරීමේ යෝජනා කෙටුම් පත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බලය ලැබී ඇති පරිදි, 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී බැංකුවේ අනුප්‍රාප්තික වයඹ සංවර්ධන බැංකුවේ නීතිමය ප්‍රතිපාදන අනුව සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.04.29 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රාදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුව නමට ලියන ලද නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එච්. එච්. ජයසිංහ මහතා විසින් සහතික කරන ලද 2006.11.23 වැනි දින අංක 10436 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ඉහල කොට්ටාරමුල්ල තැපැල් ඉහළ කොට්ටරමුල්ල, සොයිසා වත්ත අංක 40බී හි පදිංචි මීරා සායිබු මොහොම්ඩ් රහීම් මොහොමඩ් ඉම්තියාස් ණයකරු හා උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ වයඹ සංවර්ධන බැංකුවට ලැබිය යුතුව ඇති රුපියල් හාරලක්ෂ හැත්තෑපන්දහස් හත්සිය දාහතරක් (රු. 4,75,714) ක මුදල ද, එකී මුදලට 2009.03.20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වර්ෂයකට සියයට විසිඑක (21%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර, එකවර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 10436 දරන බැඳුම්කරය මගින් වයඹ සංවර්ධන බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී. සී. පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

### ඉඩමේ උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් දකුණු පිටිගල් කෝරළේ, මැද පළාතේ, ඉහල කොට්ටාරමුල්ල පිහිටි අංක 99726 දරන සිතියම සඳහන් "කජුගහ වත්ත" කියන ඉඩමේ කොටසකට වර්ෂ 1996.07.29 වැනි දින කේ. ඒ. පවුස්තිනුස් බලයලත් මිනින්දෝරු තැන මැන සාදන ලද අංක 1745 දරන සිතියමේ ප්‍රකාර බෙදූ ලොට් 01 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : කොට්ටාරමුල්ල සිට මොරකැලේට යන අල්හිරා මාවත ද, නැගෙනහිරට : අබ්දුල් කරීම් පාතුම්මාට අයිති ඉඩම ද, දකුණට : මිහිරාම් සාහිබ් මොහොමඩ් හම්සාට අයිති ඉඩම ද, බස්නාහිරට : අඩි 8ක් පළල රිසර්වේෂන් බිම් තීරය ද, වන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දොළහක් (අ. 0, රූ. 0, පර්. 12) විශාල ඉඩමේ බිම ගසකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග.

ඉහත කී ඉඩමට ප්‍රවේශ වීම සඳහා බස්නාහිර මායිමේ පිහිටි අඩි 8ක් පළල රිසර්වේෂන් බිම් තීරයේ පොදු මාර්ග අයිතිවාසිකමත් සමග වේ.

මෙම ඉඩම මාරවිල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ජේ 46/244 යටතේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. එච්. එම්. එම්. බී. ජයසිංහ,
සහකාර සාමාන්‍යාධිකාරී - අයකිරීම්,

වයඹ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 155, මීගමු පාර,
කුරුණෑගල

09-147/5

---

### සම්පත් බැංකුව පී. එල්. සී.
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පී. එල්. සී. අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1038 5325 6128.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008ක් වූ දෙසැම්බර් මස 30 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජේ. බණ්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2007 අගෝස්තු මස 02 දාතම හා අංක 1442 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පොළොන්නරුව, පලුගස්දමන, මොණරතැන්න, ට්‍රැක් 02, අංක 15හි පදිංචි හෙට්ටිආරච්චිගේ ලලිත් නිශාන්ත අල්විස්, හෙට්ටිආරච්චිගේ ජස්ටින් අල්විස් සහ කළුපහනමෙත්‍රිගේ ත්‍යාගි වත්සලා කළුපහන යන සියලු දෙනා බන්ධනදායීන් වශයෙන් හා එකී පොළොන්නරුව, පලුගස්දමන, මොණරතැන්න, ට්‍රැක් 02, අංක 15හි පදිංචි හෙට්ටිආරච්චිගේ ජස්ටින් අල්විස් උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හාරලක්ෂ අසූ අටදහස් එකසිය පනස් පහයි ශත හැට හතරක (රු. 4,88,155.64) මුදලක් 2008 අගෝස්තු මස 04 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හාරලක්ෂ අසූ අටදහස් එකසිය පනස් පහයි ශත හැට හතරක (රු. 4,88,155.64) මුදල ද, 2008 අගෝස්තු මස 05 වැනි දින සිට අංක 1442 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල් පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාරලක්ෂ පනස් පන් දහස් නමසිය පනස් එකයි ශත දහනමයක (රු. 4,55,951.19) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දාහතයි දශම පහක් (17.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම්

ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 1442 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොණරතැන්න 202 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මැද සහ එගොඩ පත්තුවේ, මොණරතැන්න ග්‍රාමයේ පිහිටි "සිරිමැදුරවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. මුදුන්කොත්ගේ විසින් සාදන ලද 2007 ජූනි මස 23 දාතම හා අංක 2089 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එෆ්. සී. පී 13 (ලොට් 750 - බී සීඕ හි බීපී) ලොට් 750හි ඉතිරි කොටස, නැගෙනහිරට : එෆ්. සී. පී. 13( එච්. එම්. රොමානිස්ගේ ඉඩම සහ පාර) හි ලොට් 752 සහ 749, දකුණට : එෆ්. සී. පී. 13 (එච් එම්. රොමානිස්ගේ ඉඩම) හි ලොට් 749 සහ බස්නාහිරට : එෆ්. සී. පී. 13 හි ලොට් 754 (දියපාර සඳහා වෙන් කිරීම) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් දෙකයි පර්චස් තිස්අටයි දශම පහක් (අ. 2, රූ. 2, පර්. 38.5) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම නමයයි බිංදුවයි හයයි හතක් (0.9067) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග ය.

එකී ලොට් අංක 01 පහත මැනවින් විස්තර කර ඇති ඉඩමේ නැවත මිනුමකි :-

එකී මොණරතැන්න 202 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මැද සහ එගොඩ පත්තුවේ, මොණරතැන්න ග්‍රාමයේ පිහිටි "සිරිමැදුරවත්ත" යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරල් විසින් සහතික කරන ලද අංක එෆ්. සී. පී. 13හි නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 750ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 750හි ඉතිරි කොටස, නැගෙනහිරට : ලොට් 749, දකුණට : බේ ලොට් 749 සහ බස්නාහිරට : ලොට් 754 (දිය පාර සඳහා වෙන් කිරීම) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකයි පර්චස් තිස්අටයි දශම පහක් (අ. 2, රූ. 0, පර්. 38.5) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග අනුව වෙළුම/පත්ඉරුව එල් ඩී ඕ/5/28/88 හි පොලොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-164/1

### සම්පත් බැංකුව පී. එල්. සී.
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1038 5302 0862.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009ක් වූ මාර්තු මස 13 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් පොලොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් එස්. රණතුංග යන අය විසින් ලියා සහතික කරන ලද 2005 දෙසැම්බර් මස 28 දාතම හා අංක 509 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පොලොන්නරුව, පලුගස්දමන, සේවාගම, අංක 85/1හි පදිංචි වික්‍රමආරච්චි අප්පුහාමිලාගේ සමරසිංහ වික්‍රමආරච්චි යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හත්ලක්ෂ විසිහය දහස් හයසිය පනස් එකයි ශත විසි තුනක (රු. 7,26,651.23) මුදලක් 2008 දෙසැම්බර් මස 18 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හත්ලක්ෂ විසිහය දහස් හයසිය පනස් එකයි ශත විසි තුනක (රු. 7,26,651.23) මුදලක්, 2008 දෙසැම්බර් මස 19 වැනි දින සිට අංක 509 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල් පියවනු ලබන දිනය තෙක්, රුපියල් පන්ලක්ෂ විසිඑක් දහස් හත්සිය හැටපහයි ශත හැටනමයක (රු. 5,21,765.69) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනයි දශම පහක් (13.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 509 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, පොලොන්නරුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තමන්කඩුව මැදපත්තුවේ, සේවාමුක්ත ජනපදය ග්‍රාමයේ පිහිටි "බදුළුළිදමන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන හා තලම්තිකරු අයි. කොටඹගේ යන අය විසින් සාදන ලද 2005 මැයි මස 01 දාතම හා අංක 1271 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එෆ්. සී. පී. පීඕ 13හි ලොට් අංක 830 සහ තඹල පාර, නැගෙනහිරට : එෆ්. සී. පී. 13හි ලොට් අංක 830 සහ 338 සහ අංක 1271 පිඹුරේ ලොට් අංක 02, දකුණට : පිඹුරු අංක 1271හි ලොට් 02 සහ බස්නාහිරට : එෆ්. සී. පී. පීඕ 13හි ලොට් අංක 828 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් තිස් හයක් (අ. 0, රූ. 3, පර්. 36) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද,

වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද, වෙළුම/පත්‍රිරුව 1/3/3/143 හි පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-164/2

---

**සීමාසහිත සම්පත් බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1069 5002 0736.

2007 දෙසැම්බර් 27 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හෝමාගම, පිට්පන උතුර, අඹරන්කුරුන්ද, අංක 122/7 හි පදිංචි කොළඹ තන්ත්‍රිගේ දොන් දමිත් නදීශාන් යන අය බන්ධනදායී වශයෙන් කොළඹ ප්‍රසද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව් ජයවීර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කල 2005 ජුනි 20 දාතම හා අංක 3379 දරන උකස් බැඳුම්කරය මගින් උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 අගෝස්තු මස 10 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හත් ලක්ෂ හතලිස් හත් දහස් හතලිහකුත් ශත හැත්තෑ එකක් (රු.747,040.71 ක් පමණයි) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් පන්ලක්ෂ හතලිස් හත් දහස් හතලිහකුත් ශත හැත්තෑඑකක් (රු. 7,47,040.71ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් හය ලක්ෂ අසූපන් දහස් අටසිය විසිපහකුත් ශත පනස් හතරක (රු.68,825.54 ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දොලහයි දශම පහ (12.5%) බැගින් 2007 අගෝස්තු 11 වැනි දින සිට එකී අංක 3379 බැඳුම්කරය මත අයවිය යුතුව හිගව ඇති සම්පූර්ණ ණය පියවා නිම වන දින තෙක් තව දුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 3379 දරන උකස් බැඳුම්කරය මගින් එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් සීමාසහිත සම්පත් බැංකුවට උකස්තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ පල්ලේපත්තුවේ හෝමාගම ප්‍රාදේශිය සභා සීමාව තුළ උතුරු පිට්පන පිහිටි "කහටගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද 2004 අගෝස්තු 01 දාතම හා අංක 4266 දරන පිඹුරේ ලොට් 2 ලෙස ලකුණු කොට නිරූපිත හෝමාගම ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව G 1478/233 හි ලියාපදිංචි කල එකී අංක 4266 පිඹුරට අනුව උතුරට : ලොට් 1ද. නැගෙනහිරට : ප්‍රසිද්ධ පාර ද, දකුණට : පී. ජී. විනීත සහ අනෙක් අය සහ ආරියලතා මල්කාන්ති අයිතිය කියන ඉඩම ද සහ බටහිරට : ලොට් 3 ද, මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විසිහතරයි දශම හයයි නවයක් (අක්. 0, රූඩ් 0, පර්. 24.69) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ සමග සහ එයට අදාළ සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද සහන හා දා සත්ව ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-165/5

---

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - කොටහේන ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2009.06.24වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

එනම්, මෙට්ස්ටීල් (ප්‍රයිවට්) ලිමිටට් බන්ධනදායීන් වශයෙන් සහ සුරේෂ් කුමාරස්වාමි උකස්කරු (බන්ධනදායියාගේ අධ්‍යක්ෂවරයෙක්) වශයෙන්ද කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී ද ෆොන්සේකා විසින් ලියා සහතික කරන ලද අංක 285 සහ 2007.05.16 දිනැති සහ දෙකම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. කනේෂයෝගන් විසින් ලියා සහතික කරන ලද අංක. 1891 සහ 2008.04.08 දිනැති සහ අංක 1889 සහ 2008.04.08 දිනැති උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

(අ) එකී අංක 285, 1891 සහ 1889 දරන උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2009.06.18 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් අසූතුන් ලක්ෂ අසූනම දහස් හත්සිය හතරයි ශත දෙක (රු. 8,389,704.02) ක මුදල සහ 2009.06.01 වැනි දින සිට රුපියල් අසූ ලක්ෂය (රු. 8,000,000) ක මුදල මත වර්ෂයකට සියයට විසි පහ (25%) බැගින් පොළිය ද සහ රුපියල් අසූ ලක්ෂය (රු. 8,000,000) ඉක්මවන මුදල මත වර්ෂයකට සියයට විසි නමය (29%) බැගින් පොළිය ද

(ආ) එකී අංක 285 සහ 1891 දරන උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2009.06.18 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් විසිදෙලක්ෂ හැට හය දහස් හාරසීය පනස් දෙකයි ශත පනස් දෙක (රු.2,266,452.52) ක මුදල සහ 2009.06.18 වැනි දින සිට රුපියල් දහනම ලක්ෂ අනූ අට දහස් අටසිය හැටයි ශත තිස් හය

(රු. 1,998,860.36) ක මුදල මත වර්ෂයකට සියයට විසි නමය (29%) බැගින් පොලිය ද

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින්ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්

(i) එකී අංක 285, 1891 සහ 1889 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් අසූතුන් ලක්ෂ අසූනම දහස් හත්සිය හතරයි ශත දෙක (රු.8,389,704.02) ක මුදල සහ 2009.06.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද ගාස්තු ද අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි 1 වැනි සහ 2 වැනි අයිතමයන් වශයෙන් වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ,

(ii) එකී අංක 285 සහ 1891 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් විසිදෙලක්ෂ හැට හය දහස් හාරසිය පනස් දෙකයි ශත පනස් දෙක (රු. 2,266,452.52) ක මුදල සහ 2009.06.18 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි 1 වැනි අයිතමය වශයෙන් වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 12, බෙල්මන්ට් වීදියේ අංක 09 හි පිහිටි එම්. එස්. ඔක්ෂන් හි බලයලත් වෙන්දේසිකරු ශ්‍රියාණි මනම්පේරි වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ රාගම් පත්තුවේ බටගම දකුණේ පිහිටි (බලයලත් මිනින්දෝරු එච්. රාජපක්ෂ විසින් මැන සාදන ලද අංක 2579 සහ 1998.03.10 දිනැති සැලැස්මේ ලොට් A දරන කැබැල්ල නැවත මැන බෙදා වෙන් කරන ලද) බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ජේ. ද සිල්වා විසින් මැන සාදන ලද අංක 6051 සහ 1999.10.09 දරන සැලැස්මේ දැක්වෙන දෙල්ගහවත්ත, ගොරකගහවත්ත, කහටගහවත්ත සහ කහටගහවත්තේ දෙකෙන් එක් පංගුවක් වන ලොට් 5 වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : ලොට් ඒ දරන කැබැල්ලේ ඉතිරි කොටස, නැගෙනහිරට : පාර දකුණට : කපුවාගර පාරේ සිට නිවාස වෙත දිවෙන පාර සහ බස්නාහිරට : ලොට් 7 යන මායිම් තුළ පිහිටි එකී අංක 6051 සැලැස්ම අනුව පර්චස් තිහයි දශම දෙක (අ. 0, රූ. 0, පර්. 30.2) ක් හෝ හෙක්ටයාර් 0.0764 ක් විශාල ඉඩම. ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 422/148 වෙළුම/පිටුවෙහි ලියාපදිංචි කර ඇත. එකී අංක 6051 සැලැස්මේ ලොට් 7 මත පොදු මාර්ග අයිතිය ද සමගින් වේ.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලයේ රාගම් පත්තුවේ බටගම දකුණේ පිහිටි දෙල්ගහවත්ත, ගොරකගහවත්ත, කහටගහවත්ත සහ කහටගහවත්තේ දෙකෙන් එක් පංගුවක් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඒ. කේ. ජේ. පෙරේරා විසින් මැන සාදන ලද අංක 3971 සහ 2002.05.23 දිනැති සැලැස්මේ ලොට් R වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : ලොට් Q, නැගෙනහිරට : විල්ප්‍රඩ් වේරගොඩගේ ඉඩම, දකුණට : අංක 6051 සැලැස්මේ ලොට් 5 දරන කැබැල්ල සහ බස්නාහිරට : අංක 6051 සැලැස්මේ ලොට් 7 (අඩි 15 ක් පළල මාර්ගය සඳහා වෙන්කිරීම) යන මායිම් තුළ පිහිටි පර්චස් නමයයි දශම පහයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 9.50) ක් හෝ හෙක්ටයාර් 0.02402 ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ වැවිලි ආදී සියළු දේ වේ. ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 675/101 වෙළුම/පිටුවෙහි ලියාපදිංචි කර ඇත.

එකී අංක 6051 සැලැස්මේ ලොට් 7 මත පොදු මාර්ග අයිතිය ද සමගින් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනීත ආරියනන්ද,
කළමණාකරු - ණය අයකර ගැනීම.

09-193/1

---

## වයඹ සංවර්ධන බැංකුව

### දේපල වෙන්දේසි කිරීමේ යෝජනා කෙටුම්පත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බලය ලැබී ඇති පරිදි 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී බැංකුවේ අනුප්‍රාප්තික වයඹ සංවර්ධන බැංකුවේ නීතිමය ප්‍රතිපාදන අනුව සම්මත කරන ලද යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.04.29 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් අයුරු සම්මත කරගන්නා ද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුව නමට ලියන ලද නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එච්. එම්. නලින් චන්ද්‍රන අබේරත්න මහතා විසින් සහතික කරන ලද 2004.10.08 වැනි දින අංක 1148 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ආනමඩුව වඩිගමංගාව හි පදිංචි අබේසිංහ හේරත් මුදියන්සේලාගේ සීතා ශ්‍රියානි බණ්ඩාර ණයකරු හා උගස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ වයඹ සංවර්ධන බැංකුවට ලැබිය යුතුව ඇති රුපියල් හැත්තෑතුන් දහස් දෙසිය අසූව (රු. 73,280)ක මුදල ද, එකී මුදලට 2006.03.05 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වර්ෂයකට සියයට විසිදෙක (22%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුන වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩු කර, එකවර අයකර ගැනීම පිණිස ඉහත අංක 1148 දරන බැඳුම්කරය මගින් වයඹ සංවර්ධන බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

### ඉඩමේ උපලේඛනය

පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ ආනමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාඩිතා පත්තුවේ 659 වඩිගමංගාව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වඩිගමංගාව නැමැති ගමේ පිහිටා ඇත්තාවූ ද භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක.... දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/ ....විසින් සම්පාදිත අංක.... දරන කට්ටි කැබීමේ .... විසින් සම්පාදිත අංක..... දරන රේඛා සටහනේ අංක ... බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් එකයි පර්චස් නැත (අක්. 01, රූඩ්. 01, පර්. 00) පමණ විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම (බ. ප. අ. 90/6628) උතුරට : ආර්. එම්. වික්‍රමසිංහගේ ඉඩම ද, නැගෙනහිරට : ආර්. එම්. සුමනාවතීගේ ඉඩම ද, දකුණට : ඒ. එච්. එම්. පුංචිබණ්ඩාගේ කුඹුර ද, බස්නාහිරට : ඒ. එච්. එම්. කුමුදුනී සිරියලතාගේ ඉඩම ද ඉහත කී ජේ. ඒ. වී. රාජනායගම් මානක තැන විසින් මැන සාදන ලද අංක 4330 සහ 2004.06.28 වැනි දින දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් එකයි පර්චස් නැත (අක්. 01, රූ. 01, පර්. 0) පමණ විශාල ඉඩමට මායිම් වනුයේ උතුරට : ආර්. එම්. වික්‍රමසිංහගේ ඉඩම ද, නැගෙනහිරට : ආර්. එම්. සුමනාවතීගේ ඉඩම ද, දකුණට : ඒ. එච්. එම්. පුංචිබණ්ඩාගේ පාර සහ ඉඩම ද, බස්නාහිරට : ඒ. එච්. එම්. කුමුදුනී සිරියලතාගේ ඉඩම ද ලෙස මායිම් වන ඉඩම සහ ඒ තුල පිහිටි සෑම ආකාර සියලු දේත් වේ.

පුත්/ආන/පු/38363 දරන වියදම් ප්‍රදාන පත්‍රයෙහි රක්ෂිත වගන්ති හා කොන්දේසි වලට යටත් වේ.

මෙම ඉඩම පුත්තලම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ එල්ඩීඕ 73/34 යටතේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි,

ඒ. එච්. එම්. එම්. බී. ජයසිංහ,
සහකාර සාමාන්‍යාධිකාරි අයකිරීම්.

වයඹ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
155, මීගමු පාර,
කුරුණෑගල.

09-147/1

---

### වයඹ සංවර්ධන බැංකුව

### දේපල වෙන්දේසි කිරීමේ යෝජනා කෙටුම්පත

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බලය ලැබී ඇති පරිදි 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී බැංකුවේ අනුප්‍රාප්තික වයඹ සංවර්ධන බැංකුවේ නීතිමය ප්‍රතිපාදන අනුව සම්මත කරන ලද යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.04.29 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් අයුරු සම්මත කරගන්නා ද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුව නමට ලියන ලද නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එච්. එම්. නලින් චන්ද්‍රන අබේරත්න මහතා විසින් සහතික කරන ලද 2006.03.27 වැනි දින අංක 1764 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ආනමඩුව තෙත්තන්කුරියාව හි පදිංචි හේරත් මුදියන්සේලාගේ හීන් බණ්ඩා සහ ආනමඩුව පුත්තලම පාර හි පදිංචි කච්චකඩුගේ ජානක ප්‍රියංකර ණයකරුවන් හා උකස්කරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ වයඹ සංවර්ධන බැංකුවට ලැබිය යුතුව ඇති රුපියල් එක්ලක්ෂ අනූහත් දහස් හත්සිය හැත්තෑව (රු. 1,97,770)ක මුදල ද, එකී මුදලට 2006.07.31 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුන වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩු කර, එකවර අයකර ගැනීම පිණිස ඉහත අංක 1764 දරන බැඳුම්කරය මගින් වයඹ සංවර්ධන බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

### ඉඩමේ උපලේඛනය

පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ ආනමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කරඹා පත්තුවේ, 655ඒ තලාකොල වැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කුඩා වැව නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ....භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක.... දරන කේෂත්‍ර පත්‍රයෙහි විසින් සම්පාදිත අංක.... දරන කුට්ටි කැබීමේ පිඹුරේ විසින් සම්පාදිත අංක ....දරන රේඛා සටහනේ අංක.... දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් දෙකක් (අ. 1, රූ. 2, පර්. 0) පමණ විශාලත්වයක් ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම (බ. ප. අ. 91/9756) උතුරට : බී. එම්. නන්දාවතීගේ ඉඩම ද, නැගෙනහිරට : මැණික්රාලගේ ඉඩම ද, දකුණට : ඇල්බට් මහතාගේ ඉඩම සහ යෝජිත පාර ද, බස්නාහිරට : යෝජිත පාර ද වේ.

එකී ඉඩම ජේ. ඒ. වී. රාජනායගම් මහතා විසින් වර්ෂ 2005ක් වූ සැප්තැම්බර් මස 05 වැනි දින මැන සාදන ලද අංක 6197 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් අ. 1, රූ. 2, පර්. 0ක් විශාල ඉඩමට මායිම් වනුයේ, උතුරට : පාර සහ නන්දාවතී සහ මැණික්රාලගේ ඉඩම ද, නැගෙනහිරට : මැණික්රාලගේ ඉඩම සහ ඇල්බට්ගේ ඉඩම ද, දකුණට : ඇල්බට්ගේ ඉඩම සහ පාර ද, බස්නාහිරට : පාර ද යන මායිම් තුළ පිහිටි ඉඩම සහ ඊට අයත් සෑම ආකාර සියලු දේත් වේ.

(පුත්/ආන/පු/50337 සහ 1996.12.20 වැනි දින දරන ජයභූමි ප්‍රදාන පත්‍රයේ දෙවන උපලේඛනයේ යෝජිත වගන්ති සහ කොන්දේසිවලට යටත් වේ.)

මෙම ඉඩම පුත්තලම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ එල්ඩීඕ 213/114 යටතේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි,

ඒ. එච්. එම්. එම්. බී. ජයසිංහ,
සහකාර සාමාන්‍යාධිකාරි අයකිරීම්.

වයඹ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 155, මීගමු පාර,
කුරුණෑගල.

09-147/4

**සම්පත් බැංකුව - පි.එල්.සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වුන)

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සම්පත් බැංකුව පී.එල්.සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය.

ගිණුම් අංකය : 1004 5316 6016.

2008 අප්‍රේල් මස 30 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුනු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, වැල්ලම්පිටිය කොහිලවත්තේ අංක 78/2 දරන ස්ථානයේ කලින් සිටි, වැල්ලම්පිටිය, වෙන්නවත්තේ අංක 235/3 හි දැනට පදිංචි අල්විස් කුලසිංහගේ මංජුල නිශාන්ත සහ විල්වල ආරච්චිගේ ප්‍රියංකා අයිරාංගනී යන දෙදෙන බන්ධනදායින් වශයෙන්, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2006 අගෝස්තු 16 දාතම හා අංක 3052 දරන උකස් බැඳුම්කරය මගින් උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය ඇප වශයෙන් ගෙන ඔවුන් වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2008 ජනවාරි 28 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අසූහය ලක්ෂ තිස් දෙදහස් හත්සිය පනස් හයකුත් ශත දහයක් (රු.8,632,756.10 ක් පමණයි) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින්, එකී රුපියල් අසූහය ලක්ෂ තිස් දෙදහස් හත්සිය පනස් හයකුත් ශත දහයක (රු.8,632,756.10 ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් අසූලක්ෂ හතලිස් දහස් තුන්සිය අනූ දෙකකුත් ශත පනස් එකක (රු.8,040,392.51 ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දාහතර (14%) බැගින් 2008 ජනවාරි 28 වන දින සිට එකී අංක 3052 දරන බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු සම්පූර්ණ හිඟ මුදල පියවා නිමා කරන දින තෙක් තව දුරටත් පොලියද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අය කර ගැනීම සඳහා එකී අංක 3052 බැඳුම්කරය මගින් එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් සීමාසහිත සම්පත් බැංකුව නමට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අලුත්කුරු කෝරලේ අඹතලෙන් පහළ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත කොහිලවත්තේ පිහිටි මුරුක්ගහකුඹුර සහ ඕවිට, මුරුක්ගහඕවිට වත්ත, වට්ටවිගෙවත්ත සහ සුදු වී කුඹුර නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද 2002 පෙබරවාරි 24 දාතම හා අංක 6410A දරන පිඹුරේ ලොට් X ලෙස ලකුණු කොට නිරූපිත, කොළඹ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව B893/187 හි ලියාපදිංචි කර ඇති එකී අංක 6410A පිඹුරට අනුව උතුරට : අංක 1797 පිඹුරේ ලොට් A හි ඉතිරි කොටස ද, නැගෙනහිරට : පාර සහ අංක 1797පිඹුරේ A ලොට් හි ඉතිරි කොටස ද, දකුණට : අංක 1797 පිඹුරේ ඉතිරි කොටසද සහ බටහිරට අංක 1797 පිඹුරේ ඉතිරි කොටස ද මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් එකක් (අක්. 0, රූඩ් 1, පර්. 0) වන බෙදා වෙන් කොට සීමා නිර්නය කල සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි, සහ අනෙකුත් සියලු දේ සහ එයට අදාල අයිතීන්, මාර්ග, වරප්‍රසාද, සහන හා දාසත්වද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-165/8

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය යටතේ දැන්වීම

2009.06.25 වන දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් එස්. එච්. රණවක විසින් සහතික කරන ලද 2003.12.16 දිනැති අංක 1885 දරන බැඳුම්කරය සහ ඇප ලිපිය මත මුල් මුදල හා 2009.04.01 දින තෙක් පොලිය වශයෙන් රුපියල් හතලිස් පන් ලක්ෂ හැටදහස් දෙසීයයි ශත හතලිස් හතක (රු.45,60,200.47) මුදලක් සමග රුපියල් දාහත් ලක්ෂ හැත්තෑ එක් දහස් හත්සිය හතලිස් අටයි ශත දහඅටක (රු.17,71,748.18) මුදලක් මත 2009.04.02 වෙනි දින සිට වසරකට සියයට තිස්හතර (34%) බැගින් තවදුරටත් පොලියක්ද, 2009.04.01 දක්වා ණය ගිණුම මත මුල් මුදල හා පොලියද ඒ සමග රුපියල් විසිලක්ෂ පනස්තුන් දහස් දෙසීය පනස් දෙකයි ශත අනූපහක (රු.20,53,252.95) මුදලක් මත වසරකට සියයට විසිඅටයි දශම පහ (28.5%) බැගින් පොලියක්ද ගෙවීම නිම කරන දිනය තෙක් කොළඹ 05, ඇල්විටිගල මාවතේ, අංක 526 හි සීමාසහිත ටෙක්සෝන් ටෙක්නොලොජීස් (පුද්ගලික) සමාගමෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක. 1885 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් හතලිස් පන්ලක්ෂ හැටදහස් දෙසීයයි ශත හතලිස් හතක (රු.45,60,200.47) මුදල සමග 2009.04.01 වෙනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 05, හැව්ලොක් පාර, 290 හි පදිංචි ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරුන් හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේද, ලංකා බැංකුව ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළකිරීමට ලංකා බැංකුව, අගනුවර ශාඛාවේ, අයකරගැනීම් හා ණය සුපරීක්ෂණ දෙපාර්තමේන්තුවේ, කළමනාකරුටද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**විකිණීමට ඇති දේපල**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය සභාව තුල (බත්තරමුල්ල - තලංගම ඒකකය) හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුවේ තලංගම දකුණ ග්‍රාමයේ, බත්තරමුල්ලෙහි, රොබට් ගුණවර්ධන මාවතෙහි පිහිටි රොබට් ගුණවර්ධන මාවත, දැනට වරිපනම් අංක 202/6 දරන ගොඩනැගිල්ල සහිත නාරංගහවත්ත නොහොත් නාගහවත්ත නමැති

ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඩී. ලියනසූරියගේ විසින් සාදන ලද 1994 ඔක්තෝම්බර් 16 දිනැති අංක 6011 දරන පිඹුරෙහි ලොට් 2A2A ලෙස සටහන් කොට සීමා නිර්ණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල, එනම් ලොට් 2A2A, උතුරට : ලොට් 2A1 ද, නැගෙනහිරට : සිරි ඩී ලියනසූරිය විසින් සාදන ලද අංක 2187 දරන පිඹුරෙහි ලොට් 5 ද, දකුණට : එම ඉඩමේ ලොට් 2A2B ද, බස්නාහිරට : ඩෙසි සමරනායකට සහ වෙනත් අයට අයිති ඉඩමද, මායිම්ව එකී අංක. 6011 දරන පිඹුර ප්‍රකාර පර්චස් දොළහක (අ. 0, රූ. 0, පර්. 12) වපසරියකින් යුක්ත වන අතර, එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, ඇතුළු සියළු දේද වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G659/289 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

මේ සමගම මෙයට පහත සඳහන් ඉඩම මතින් පාරේ අයිතිය ද ඇත. ඉහත කී බත්තරමුල්ල පිහිටි නාරංගහවත්ත නොහොත් නාගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඩී. ලියනසූරිය විසින් සාදන ලද 1981 මාර්තු 13 වන දිනැති අංක 2187 දරන පිඹුරෙහි ලොට් 5 (අඩි 15 පළල පාරට වෙන්කළ කොටස) ලෙස දක්වා මායිම් නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 5 උතුරට රොබට් ගුණවර්ධන මාවතද, නැගෙනහිරට ලොට් 4 ද, දකුණට ලොට් 3 ද, බස්නාහිරට ලොට් 2 සහ 1 ද මායිම්ව එකී අංක. 2187 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිහතරකින් (අ. 0, රූ. 0, පර්. 24) යුක්තවන අතර, එහි ඇති සියළු දේද වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G659/290 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අයි. එම්. පණ්ඩිතරත්න,
කළමනාකරු.

ලංකා බැංකුව,
අගනුවර ශාඛාව,
අයකරගැනීම් හා ණය සුපරීක්ෂණ,
යෝර්ක් වීදිය,
කොළඹ 01.

09-107

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා සම්මුතිය.

ගිණුම් අංක : 0025 5002 7022

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ මාර්තු මස 13 වෙනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් සී. බී. දෙහිගම යන අය විසින් ලියා සහතික කරන ලද 2007 අගෝස්තු 17 දාතම හා අංක 38284 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මාතලේ, මඩවල, උල්පොත කොහොලන්වෙල "ඕල්ඩ් ස්පයිස් ගාර්ඩන්" අංක 27 හි පදිංචි විතාරන පතිරණගේ සංජීව ලක්ෂ්මන් විතාරන යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් නමලක්ෂ තිස්දහස් හයසියය හැත්තෑ අටයි ශත හතලිස් හයක (රු.930,678.46) මුදලක් 2009 ජනවාරි 05 වෙනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් නමලක්ෂ තිස්දහස් හයසිය හැත්තෑ අටයි ශත හතලිස් හයක (රු.930,678.46) මුදලත් 2009 ජනවාරි 06 දින සිට අංක 38284 දරන බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අට ලක්ෂ පහළොස් දහස් හයසිය අසූතුනයි ශත හැට තුනක (රු.815,683.63) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 38284 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර උඩුගොඩ උඩසිය පත්තුවේ, කොහොලන්වෙල පිහිටි ඇල්හේන කනත්ත කැටකලගහමුල්ලහේන යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන. ඊ. වී. සිරිසුමන යන අය විසින් සාදන ලද 2004 ජනවාරි 26 දාතම හා අංක 4685 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1 බී වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් ඊසානට දඹල්ල සිට මාතලේ දක්වා දිවෙන මාර්ගය ගිණිකොනට : නන්ද සිල්වා යන අය විසින් වර්තමානයේ හිමිකම් කියන දම්මන්හේන වෙන්කරන කම්බි සහ පැළඉනි වැට නිරිතට : බර්නි වීරසිංහ යන අය විසින් වර්තමානයේ හිමිකම් කියන ඇල්හේන කනත්ත වෙන්කරන කම්බි සහ පැළඉනි වැට සහ වයඹට : අංක 4685 පිඹුරේ ලොට් 1 ඒ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් 3 පර්චස් දහ තුනක් (A0, R3, P13) විශාල ඉඩම් කොටස සමග වගාවන්, සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද. වරප්‍රසාදයන් ප්‍රවශවතායන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයක් ද, වෙළුම/පත්ඉරුව ඩී 477/214 හි මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-164/4

---

**සම්පත් බැංකුව - PLC**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සම්පත් බැංකුවේ පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංක : 1006 5023 9177.

2007 දෙසැම්බර් මස 27 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉඳුල්ගොඩකන්ද, කටුපිටිය, කම්බියාඩිය පදිංචි ගෝනයාලගේ ගෙදර ශ්‍රියානන්ද නොහොත් ගෝනයාලගේ ගෙදර මන්ජුල ශ්‍රියානන්ද එදිරිසිංහ සහ රන්පටිදූර දේවගේ කාන්ති ජයතිස්ස යන දෙදෙන බන්ධනදායින් වශයෙන් සහ ඉහත කී ඉඳුල්ගොඩකන්ද කටුපිටිය, කම්බියාඩිය පදිංචි එකී ගෝනයාලගේ ගෙදර ශ්‍රියානන්ද නොහොත් ගෝනයාලගේ ගෙදර මන්ජුල ශ්‍රියානන්ද එදිරිසිංහ යන අය උකස්කරු වශයෙන් ද, කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජේ. බණ්ඩාර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කල 2005 ජූලි 19 දාතම හා අංක 227 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය ඇපයට ගෙන ඔවුන් වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 අගෝස්තු මස 06 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අට ලක්ෂ විසිහය දහසක (රු. 8,26,000 පමණයි) මුදලක් එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිගව ඇති හෙයින් එකී රුපියල් අට ලක්ෂ විසිහය දහසක (රු. 8,26,000 ක් පමණයි) සම්පූර්ණ මුදල සමග තවත් රුපියල් හත්ලක්ෂ විසිඅට දහසක (රු. 7,28,000ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහසය (16%) බැගින් 2007 අගෝස්තු මස 07 වැනි දින සිට එකී අංක 227 බැඳුම්කරය මත අයවිය යුතුව හිඟව ඇති සම්පූර්ණ ණය පියවා නිම වන දින තෙක් තව දුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 227 දරන උකස් බැඳුම්කරය මගින් එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් සීමාසහිත සම්පත් බැංකුවට උකස්තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බඩ පත්තුවේ, ගල්බඩ කෝරලේ එලුගල්ල ගමේ පිහිටි "කලඹටුවාවහේන" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් විසින් සාදන ලද 2005 ජනවාරි 25 දාතම හා අංක 3126 දරන පිඹුරේ ලොට් 1 ලෙස ලකුණු කොට නිරූපිත උතුරට : කුපිවත්ත ද, නැගෙනහිරට : කලටුවාවහේන ද, දකුණට : නිවාස වල සිට ප්‍රධාන මාර්ගයට දිවෙන පාර ද, සහ බටහිරට: කලටුවාවහේන ද මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසිතුනයි දශම දෙකයි හයක් (අක්. 0, රූඩ්. 1, පර්. 23.26) වන බෙදා වෙන් කොට සීමා නිර්නය කල සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ සමග සහ එයට අදාල සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද සහන හා දාසත්ව ද සමග ඉහත කී ලොට් 1 පහත වඩාත් මැනැවින් විස්තර කොට ඇති ඉඩමේ ප්‍රතිමිනුමකි.

ඉහත කී එලුගල්ල ගමේ පිහිටි "කලඹටුවාවෙහේන" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් විසින් සාදන ලද 1989 දෙසැම්බර් 16 දාතම හා අංක 5357/560 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් ලකුණු කොට නිරූපිත කෑගල්ල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව D584/265 හි ලියාපදිංචි කර ඇති උතුරට : කුපිවත්ත ද, නැගෙනහිරට : එම පිඹුරේම ලොට් 1 ද, දකුණට : දුම්රිය රක්ෂිතය ද සහ බටහිරට : ලොට් 3, 7 සහ 6 ද මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසිතුනයි දශම දෙකක් (අක්. 0, රූඩ් 1, පර්. 23.2) වන සම්පූර්ණ ඉඩම එහි වන බෙදා වෙන් කොට සීමා නිර්නය කල සම්පූර්ණ බිම් කොටස එහි පස ගහකොළ වගාවන් ගොඩනැගිලි සහ අනිකුත් සියළු දේ සමග සහ එයට අදාල සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද සහන හා දාසත්වද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-165/6

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 1025 5008 8719.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ මාර්තු මස 13 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් සී. බී. දෙහිගම යන අය විසින් ලියා සහතික කරන ලද 2005 අගෝස්තු 17 දාතම හා අංක 36865 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මාතලේ, වීරපුරන් අප්පු පෙදෙස, 36/7 සහ මාතලේ නාගොල්ල ගම පාර අංක 78 හි පදිංචි උඩුගම ගමගේ සමන්ත සහ අස්ගිරියේ ගෙදර රසිකා ප්‍රියංගනී කුලතුංග යන දෙදෙනා බන්ධනදායීන් වශයෙන් හා එකී උඩුගම ගමගේ සමන්ත උකස්කරු වශයෙන්ද පැහැර හැර ඇති හෙයින්ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හයලක්ෂ හැටහතර දහස් දෙසිය හයයි ශත විසි දෙකක (රු.664,206.22) මුදලක් 2009 ජනවාරි 06 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හයලක්ෂ හැටහතර දහස් දෙසිය හයයි ශත විසි දෙකක (රු.664,206.22) මුදලක් 2009 ජනවාරි මස 07 වැනි දින සිට අංක 36865 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පන්ලක්ෂ හැත්තෑ හත් දහස් නමසිය අසූහතරයි ශත විසි එකක (රු.577,984.21) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 36865 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

## උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දකුණු මාතලේ, කොහොන්සිය පත්තුවේ, තැන්නේ පිහිටි දුනුමදලගහමුල්ල හේන යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන යූ. එච්. බී. කේ. එම්. ටී. අංගම්මන යන අය විසින් සාදන ලද 2003 අගෝස්තු මස 20 වැනි දින බෙදා වෙන් කරන ලද සහ 2003 ජූලි 30 දාතම හා අංක 1175 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 09 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට සහ නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 13 වශයෙන් ලකුණු කොට ඇති අඩි 15 පළල මාර්ග පිවිසුම දකුණට : ලොට් 8 සහ බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 14 යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොලහක් (අ. 0, රූ. 0, පර්. 12) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද, වගාවන් ද එකී පිඹුරේ ලකුණු කොට ඇති මාර්ග භාවිතා කිරීමේ අයිතිය ද වෙළුම/පත්ඉරුව බී 562/131 හි මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-164/5

---

## නිවැරදි කිරීමයි

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනත යටතේ 2009.02.20 වැනි දින *ගැසට් පත්‍රයේ* පළ කරන ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම සම්බන්ධයෙන් පහත සඳහන් සංශෝධනය කරන ලදී. එකී සංශෝධනය වන්නේ කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474 දරන ස්ථානයේ මහානාම ඩ්‍රයිව් හි ආර්. එම්. එස්. ඔක්ෂන්ස් හි ආර්. එස්. මහානාම යන වෙන්දේසිකරු වෙනුවට කොළඹ 12, බෙල්මන්ට් වීදියේ, එම්. එස්. ඔක්ෂන්ස් හි එස්. මනම්පේරි යන වෙන්දේසිකරුව ආදේශ කරනු ලැබීම බව සලකන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්. එස්. ද සිල්වා විසින් බැංකුවට උකස්කරන ලද ගම්පහ දිස්ත්‍රික්කයේ රද්දොලුව දඹදුරේ පිහිටි බෝගහවත්ත සහ ගාල්ල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් මැන සාදන ලද අංක. 2902 දරන පිඹුරේ ලොට් අංක 37, ගම්පහ දිස්ත්‍රික්කයේ රද්දොලුව දඹදුරේ පිහිටි බෝගහවත්ත සහ ගාල්ල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 2902 දරන පිඹුරේ ලොට් අංක 38.

පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනීත ආරියනන්ද,
කළමනාකරු ණය අයකර ගැනීම්

09-193/7

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 1082 5331 7129

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ මැයි මස 28 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. ඩී. සුනාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2007 ඔක්තෝබර් 16 දාතම හා අංක 1791 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබා දුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නුගේගොඩ, මිරිහාන, පරණ කොට්ටාව පාර, ආක 211/67හි පදිංචි වැලිවිට සායක්කාරගේ චන්ද්‍රා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැත්තෑ තුන් ලක්ෂ තුන් දහස් හයසිය හතලිස් අටයි ශත අසූ තුනක (රු. 7,303,648.83) මුදලක් 2009 අප්‍රේල් මස 16 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හැත්තෑ තුන් ලක්ෂ තුන් දහස් හයසිය හතලිස් අටයි ශත අසූතුනක (රු. 7,303,648.83) මුදල ද 2009 අප්‍රේල් මස 17 වැනි දින සිට අංක 1791 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් නමලක්ෂ තිස් දහස් හයසිය පනස් හතරයි ශත පනහක (රු. 5,930,654.50) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහඅටක් (18%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1791 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ(විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුව, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුල දකුණු හෝකන්දර පිහිටි "දවටගහවත්ත, දෙල්ගහවත්ත කොටස" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. යූ. එස්. ප්‍රනාන්දු විසින් සාදන ලද 2007 අගෝස්තු මස 12 දාතම හා අංක 1523 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් ඒ වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : හෝකන්දර, දකුණු හෝකන්දර, වරිපනම් අංක 107/8, 107/4, දරන පරිශ්‍රයන්, නැගෙනහිරට : ලොට් බී, දකුණට : මල්වත්ත පාර සහ බස්නාහිරට : හෝකන්දර, දකුණු හෝකන්දර, වරිපනම් අංක 106 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහලවයි දශම එකයි බිංදුවක් (අක්. 0, රූ.0, පර්. 15.10) විශාල ඉඩම් කොටස, සමග පස, ගහකොළ, වගාවන්, සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 1523 ට අනුව වෙළුම/පත්ඉරුව ජී 1611/235 හි හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

09-165/7

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ගිණුම් අංක : 0061 5000 0295, 0061 1000 0543 සහ 0061 1000 0543.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ මැයි මස 28 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් ටී. එම්. ආර්. සේනානායක යන අය විසින් ලියා සහතික කරන ලද 2004 ජූලි මස 19 දාතම හා අංක 62 සහ ආර්. අලහේන්ද්‍ර යන අය විසින් ලියා සහිත කරන ලද 2006 අගෝස්තු මස 07 දාතම හා අංක 1610 සහ ජී. එන්. එම්. කෝදාගොඩ විසින් ලියා සහතික කරන ලද 2007 පෙබරවාරි මස 20 දාතම හා අංක 158 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබා දුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොස්වත්ත, කඩුවෙල පාර, අංක 260/බී හි "අනුෂ මෙඩිකල්ස් " යන ව්‍යාවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන අංගොඩ කුඩාබුත්ගමුව, අංක 342හි පදිංචි වෙලහෙට්ටිගේ දොන් ඇලෙක්ස් කුමාර මර්සලින් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියන් විසිඑක් ලක්ෂ දහත් දහස් නමසිය දහතයි ශත අසූතුනක (රු. 21,17,917.83) මුදලක් 2009 ජනවාරි මස 27 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් විසිඑක් ලක්ෂ දාහත් දහස් නමසිය දාහතයි ශත අසූතුනක (රු. 21,17,917.83) මුදල ද 2009 ජනවාරි මස 28 වැනි දින සිට අංක 62, 1610 සහ 158 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙලක්ෂ අසූහතර දහස් තුන්සිය හැට හතයි ශත හතලිස් හතරක (රු. 2,84,367.44) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහහතක් (17%) බැගින් වූ පොලිය ද, හා තවත් එකොළොස් ලක්ෂ අසූදහස් අටසිය අනූපහයි ශත අසූ හතක (රු. 11,80,895.87) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනයි දශම පහක් (13.5%) බැගින් වූ පොලිය ද, හා තවත් රුපියල් තුන්ලක්ෂ අනූඑක් දහස් හයසිය හැත්තෑ එකක (රු. 3,91,671) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවක් (15%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 62, 1610 සහ 158 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ(විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරළේ, අඹතලෙන් පහල කොටිකාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කුඩාබුත්ගමුවෙහි පිහිටි වෝඩ් අංක 3 මහාබුත්ගමුව වරිපනම් අංක 10 දරන "කිරිවැල්දෙනියේවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වන එස්. රාසප්පා යන අය විසින් සාදන ලද 1998 ඔක්තෝබර් මස 31 දාතම හා අංක 65/98 දරන පිඹුරේ බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 12 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 10 සහ පාර, නැගෙනහිරට : පාර සහ ලොට් 14, දකුණට : ලොට් 14 සහ නිව්ටන් රණසිංහගේ ඉඩම සහ බස්නාහිරට : ලොට් 10 සහ නිව්ටන් රණසිංහගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම දෙකයි හයක් (අ. 0, රූ. 0, පර්. 8.26) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 65/98ට අනුව වෙළුම/පත්‍රුරුව බී 935/252හි කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී පිඹුරු අංක 65/98හි නිරූපිත ලොට් 15 සහ 16 මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

09-165/4

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ගිණුම් අංක : 0025 5002 0443.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ මාර්තු මස 13 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් සී. බී. දෙහිගම යන අය විසින් ලියා සහතික කරන ලද 2006 ඔක්තෝබර් මස 23 දාතම හා අංක 37573 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබා දුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මාතලේ, කවුඩුපැල්ලැල්ල සපුමල් මාවත, අංක 26/27හි දැනට පදිංචි මාතලේ, කවුඩුපැල්ලැල්ල හපුගහලන්ද එස්ටේට් අංක 26හි පදිංචි හේරත් මුදියන්සේලාගේ රංජිත් ධර්මවර්ධන නොහොත් හේරත් මුදියන්සේ රාලහාමිලාගේ රංජිත් ධර්මවර්ධන යන අය බන්ධනදායීන් වශයෙන් පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හාරලක්ෂ අසූදහස් හත්සිය පනස් තුනයි ශත අසූ තුනක (රු. 4,80,753.83) මුදලක් 2008 දෙසැම්බර් මස 16 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හාරලක්ෂ අසූදහස් හත්සිය පනස් තුනයි ශත අසූ තුනක (රු. 4,80,753.83) මුදල ද 2008 දෙසැම්බර් මස 17 වැනි දින සිට අංක 37573 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාරලක්ෂ විසිදහස් හත්සිය අනූතුනයි ශත හයක (රු. 4,20,793.06) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහඅටක (18%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර

ගැනීම සඳහා, අංක 37573 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ(විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දකුණ මාතලේ අස්ගිරි පල්ලෙසිය පත්තුවේ, කවුඩුපැලැල්ල පිහිටි හපුගහලන්ද වත්ත යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. රාජසේකරන් යන අය විසින් සාදන ලද 1996 මැයි මස 15 වැනි දින බෙදා වෙන්කළ සහ 1996 මැයි මස 13 දාතම හා අංක 3740 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට එක දේපළක් නිර්මාණය කරන ලොට් 26 සහ 27 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 30 වශයෙන් ලකුණු කොට ඇති අඩි 17 පළල මාර්ග පිවිසුම, නැගෙනහිරට : මාර්ග පිවිසුම සහ ලොට් 31හි කොටසක්, දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස සහ බස්නාහිරට : ලොට් 23 යන මායිම් තුළ පිහි ප්‍රමාණයෙන් පර්චස් තිස් එකයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 31.75) විශාල ඉඩම් කොටස සමග වගාවන්, සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද එකී පිඹුරේ ලකුණු කොට ඇති මාර්ගයන් භාවිතා කිරීමේ අයිතිය ද, වෙළුම/පත්ඉරුව බී 529/52හි මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

09-164/3

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

*** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | *පිටපතක මිළ* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති *උපලේඛනයේ* දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2009** | | | |
| සැප්තැම්බර් | 2009.09.03 | බ්‍රහස්පතින්දා | 2009.08.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.09.11 | සිකුරාදා | 2009.08.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.09.18 | සිකුරාදා | 2009.09.03 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2009.09.25 | සිකුරාදා | 2009.09.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2009.10.02 | සිකුරාදා | 2009.09.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.10.09 | සිකුරාදා | 2009.09.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.10.16 | සිකුරාදා | 2009.10.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.10.23 | සිකුරාදා | 2009.10.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.10.30 | සිකුරාදා | 2009.10.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2009.11.06 | සිකුරාදා | 2009.10.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.11.13 | සිකුරාදා | 2009.10.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.11.20 | සිකුරාදා | 2009.11.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.11.27 | සිකුරාදා | 2009.11.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.